# මූලික පිරිවෙන් අවසාන විභාගය

# ඇගයීම් වාර්තාව

# 01-සිංහල

# 2020

Curriculum
Assessment & Evalution
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

අ.පො.ස (සා.පෙළ) මට්ටමේ පවතින මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක හෝ අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවෙණාචාර්යවරු ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මූලික පිරිවෙන් අවසාන විභාගය 2020 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තා ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවෙණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා 5ක් යටතේ ගොනු කර ඇත.
මූලික පිරිවෙන් සිංහල විෂයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මකව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I පත්‍රයේ ව්‍යුහය, I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය, I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේ ද I ප්‍රශ්න පත්‍රයට අදාළ ව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයෙන් ම ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමනය හා යෝජනා ද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතර හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කරගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රියව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමු කරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2023 ජනවාරි 06
පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

## පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබාදීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දැ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මඟින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි සනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

වර්තමානයේ දී සාමාන්‍ය පෙළ විභාගය හා සම මට්ටමේ ලා සලකනු ලබන මෙම විභාගයේ දී අපේක්ෂයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් දෙකක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් මූලික පිරිවෙන් අවසන් විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා, පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරීන්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා තනන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඩී.ඩී.වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන ශාඛාව - ආයතනික විභාග) |
| විෂය සම්බන්ධීකරණය | : | එච්.කේ.සී.කේ. කුමාරි<br>සහකාර විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන ශාඛාව |
| සංස්කරණය | : | ශ්‍රියානි අබේවික්‍රම<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I (විශ්‍රාමික)<br>360/6, මායා මාවත,<br>මාකුඹුර, පන්නිපිටිය |
| ලේඛක මණ්ඩලය | : | ශාස්ත්‍රපති පූජ්‍ය කඩවත රතනවංශ හිමි<br>නියෝජ්‍ය පරිවේණාධිපති<br>ජාතික භික්ෂු අධ්‍යයන ආයතන මහ පිරිවෙන<br>රන්මුතුගල - කඩවත<br><br>ශාස්ත්‍රපති ගලහිටියේ අමරවංශ හිමි<br>නියෝජ්‍ය පරිවේණාධිපති<br>සිරි සරණංකර පිරිවෙන<br>වලස්ගල<br><br>ශ්‍රියානි අබේවික්‍රම<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I (විශ්‍රාමික)<br>360/6, මායා මාවත,<br>මාකුඹුර, පන්නිපිටිය<br><br>ඩබ්.ඒ.ඩබ්. වනසුන්දර<br>ගුරු උපදේශක (විශ්‍රාමික)<br>අක්කර දහය පාර,<br>පොල්වත්ත,<br>අම්බුළුගල, මාවනැල්ල |
| පරිගණක පිටපත සැකසුම | : | එම්.ඒ. චතුරිකා මධුමාලි<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |

# පටුන

පිටු අංකය


**1. සිංහල විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු** 02

**1.1** සිංහල විෂයය අධ්‍යයනයේ අරමුණු **02**

**1.2** විෂය සාධනය පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු **03**

1.2.1 විෂයය සඳහා පෙනීසිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 03

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය 03

1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය දිස්ත්‍රික්ක අනුව 04

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 05

**I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය**

**2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** 07

**2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය** 07

**2.2. I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න 1 සිට 40 දක්වා)** 08

**2.3.** I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 14

**2.4.** I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය 15

**2.5.** I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 16

**2.6.** I ප්‍රශ්න පත්‍රය සඳහා තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණය 17

**2.7.** I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 19

**II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය** 40

**3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** 41

**3.1.** II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 41

**3.2.** II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 42

**3.3.** II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 42

**3.4.** II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 43

**3.5.** II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය 44

**3.6.** II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණය හා නිගමන 64

**4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමුකළ යුතු කරුණු** 65

**5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා** 66

# I කොටස

## 1.0 සිංහල විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 සිංහල විෂයය අධ්‍යයනයේ අරමුණු

1. ශ්‍රවණය, කථනය, කියවීම සහ ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කිරීම.
2. සිංහල භාෂාවේ ව්‍යාකරණ සහ භාෂා සම්ප්‍රදාය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.
3. භාෂාවේ වාච්‍යාර්ථ, ලක්‍ෂ්‍යාර්ථ, ව්‍යංග්‍යාර්ථ වටහා ගැනීම.
4. ප්‍රකාශනය, ව්‍යවහාරය හා අර්ථ ග්‍රහණ ශක්තිය වර්ධනය කරලීම.
5. අවබෝධය, විශ්ලේෂණය, සංස්ලේෂණය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම.
6. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලි හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම අවබෝධය ලබා ගැනීම හා වාග්මාලාව පෝෂණය කර ගැනීම.
7. විවිධ යුගවලට අයත් සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.
8. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් රසඥතාව වර්ධනය කර ගැනීම තුළින් ජීවිත පරිඥානය පුළුල් කර ගැනීම.
9. විශ්වවිශ්‍රැති සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්‍ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරිම.
10. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනයට හුරු කිරීම.
11. සිංහල භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව සහ තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.
12. සන්නිවේදන කාර්යය පහසුකරලීම සඳහා සම්ප්‍රදායික භාෂා උපාංග නිවැරදි ව භාවිතයට හුරු කිරීම.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2531 | 32 | 2563 |
| ඉංග්‍රීසි | 18 | 1 | 19 |
| එකතුව | **2549** | **33** | **2582** |

වගුව **1.1**

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 49 | 1.92 | 0 | 0.00 | 49 | 1.90 |
| B | 108 | 4.24 | 1 | 3.03 | 109 | 4.22 |
| C | 720 | 28.25 | 11 | 33.33 | 731 | 28.31 |
| S | 1160 | 45.51 | 15 | 45.45 | 1175 | 45.51 |
| W | 512 | 20.09 | 6 | 18.18 | 518 | 20.06 |
| එකතුව | **2549** | **100.00** | **33** | **100.00** | **2582** | **100.00** |

වගුව **1.2**

## 1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 155 | 5 | 3.23 | 8 | 5.16 | 66 | 42.58 | 60 | 38.71 | 139 | 89.68 | 16 | 10.32 |
| ගම්පහ | 213 | 3 | 1.41 | 7 | 3.29 | 68 | 31.92 | 93 | 43.66 | 171 | 80.28 | 42 | 19.72 |
| කළුතර | 176 | 6 | 3.41 | 8 | 4.55 | 66 | 37.50 | 64 | 36.36 | 144 | 81.82 | 32 | 18.18 |
| මහනුවර | 310 | 11 | 3.55 | 19 | 6.13 | 114 | 36.77 | 123 | 39.68 | 267 | 86.13 | 43 | 13.87 |
| මාතලේ | 81 | 1 | 1.23 | 1 | 1.23 | 20 | 24.69 | 42 | 51.85 | 64 | 79.01 | 17 | 20.99 |
| නුවරඑළිය | 43 | 2 | 4.65 | 3 | 6.98 | 7 | 16.28 | 20 | 46.51 | 32 | 74.42 | 11 | 25.58 |
| ගාල්ල | 203 | 1 | 0.49 | 17 | 8.37 | 55 | 27.09 | 83 | 40.89 | 156 | 76.85 | 47 | 23.15 |
| මාතර | 172 | 1 | 0.58 | 10 | 5.81 | 60 | 34.88 | 72 | 41.86 | 143 | 83.14 | 29 | 16.86 |
| හම්බන්තොට | 133 | 0 | 0.00 | 4 | 3.01 | 36 | 27.07 | 66 | 49.62 | 106 | 79.70 | 27 | 20.30 |
| වවුනියාව | 03 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 33.33 | 1 | 33.33 | 2 | 66.67 | 1 | 33.33 |
| අම්පාර | 91 | 0 | 0.00 | 5 | 5.49 | 7 | 7.69 | 50 | 54.95 | 62 | 68.13 | 29 | 31.87 |
| ත්‍රිකුණාමලය | 21 | 0 | 0.00 | 0 | 0.00 | 6 | 28.57 | 10 | 47.62 | 16 | 76.19 | 5 | 23.81 |
| කුරුණෑගල | 263 | 8 | 3.04 | 8 | 3.04 | 55 | 20.91 | 130 | 49.43 | 201 | 76.43 | 62 | 23.57 |
| පුත්තලම | 61 | 0 | 0.00 | 1 | 1.64 | 8 | 13.11 | 34 | 55.74 | 43 | 70.49 | 18 | 29.51 |
| අනුරාධපුර | 169 | 3 | 1.78 | 5 | 2.96 | 29 | 17.16 | 87 | 51.48 | 124 | 73.37 | 45 | 26.63 |
| පොළොන්නරුව | 57 | 0 | 0.00 | 0 | 0.00 | 9 | 15.79 | 25 | 43.86 | 34 | 59.65 | 23 | 40.35 |
| බදුල්ල | 113 | 3 | 2.65 | 6 | 5.31 | 27 | 23.89 | 60 | 53.10 | 96 | 84.96 | 17 | 15.04 |
| මොණරාගල | 91 | 0 | 0.00 | 0 | 0.00 | 26 | 28.57 | 53 | 58.24 | 79 | 86.81 | 12 | 13.19 |
| රත්නපුර | 117 | 4 | 3.42 | 4 | 3.42 | 32 | 27.35 | 58 | 49.57 | 98 | 83.76 | 19 | 16.24 |
| කෑගල්ල | 110 | 1 | 0.91 | 3 | 2.73 | 39 | 35.45 | 44 | 40.00 | 87 | 79.09 | 23 | 20.91 |
| සමස්ත ප්‍රතිඵලය | 2582 | 49 | 1.90 | 109 | 4.22 | 731 | 28.31 | 1175 | 45.51 | 2064 | 79.94 | 518 | 20.06 |

වගුව **1.3**

### 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 00 | 0.00 | 2582 | 100.00 |
| 81 - 90 | 05 | 0.19 | 2582 | 100.00 |
| 71 - 80 | 36 | 1.39 | 2577 | 99.81 |
| 61 - 70 | 103 | 3.99 | 2541 | 98.41 |
| 51 - 60 | 268 | 10.38 | 2438 | 94.42 |
| 41 - 50 | 543 | 21.03 | 2170 | 84.04 |
| **31 - 40** | **737** | **28.54** | **1627** | **63.01** |
| 21 - 30 | 580 | 22.46 | 890 | 34.47 |
| 11-20 | 266 | 10.30 | 310 | 12.01 |
| 01 - 10 | 44 | 1.70 | 44 | 1.70 |
| 00 - 00 | 00 | 0.00 | 00 | 0.00 |

වගුව **1.4**

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 31 - 40 පන්ති ප්‍රාන්තරය සලකා බලන විට,
සිංහල විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2582 අතුරෙන් 31 - 40 පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 737කි. එය ප්‍රතිශතයක් වශයෙන් 28.54%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 1627ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 63.01%කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2.0 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

**I පත්‍රය** - කාලය : පැය **03** යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

I කොටස - වරණ 4 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40කි.** ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් ලකුණු 40කි.

II කොටස - මෙම කොටස ප්‍රශ්න **පහකින්** සමන්විත ය.
ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටස සඳහා ලකුණු 80කි.

1 ප්‍රශ්නය : කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත ය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

2 ප්‍රශ්නය : රචනය : ලකුණු 25කි. (ව්‍යූහගත තේමා 4ක් අතුරෙන් එකක් තෝරා ගත යුතු ය.)

3 ප්‍රශ්නය : සාරාංශකරණය : ලකුණු 10කි.

4 ප්‍රශ්නය : අවබෝධය : ලකුණු 10කි.

5 ප්‍රශ්නය : ප්‍රායෝගික ලේඛනය : ලකුණු 15කි. (වෛකල්පික ප්‍රශ්න කොටස් **දෙකකින්** ප්‍රශ්න **එකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

I පත්‍රය සඳහා මුළු ලකුණු = 40 + 80 = 120

## 2.2 I ප්‍රශ්න පත්‍රය - I කොටස

### I කොටස

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

- අංක **1** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

*(ලකුණු 01 × 40 = 40 යි)*

- අංක **1** සිට **3** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප පිළිතුර තෝරන්න.

1. එයා ඉතින් හැමදාම කළේ අනුන්ගේ පාතෙන් එළිය බැලීමනෙ
   (1) අනුන්ගේ පිහිටෙන් තමාගේ කටයුතු කර ගැනීම
   (2) අපතේ යන දෙයින් ප්‍රයෝජනයක් ගැනීම
   (3) අනුන්ට උදව් කර එයින් තමනුත් ප්‍රයෝජන ලැබීම
   (4) අනුන්ට පහන් දල්වා ආලෝකය ලබා දීම

2. අන්තිමේ දී මෙහෙ ම අබග්ගයක් වෙයි කියල මම කලින් ම හිතුව
   (1) අමනාපයක් (2) කළකිරීමක්
   (3) අවාසනාවන්ත සිදුවීමක් (4) ලැජ්ජාවක්

3. ඔය කතාවලට හුම්ටි තියල මට නිකං දොස් අහන්න බැහැ
   (1) ප්‍රතික්ෂේප කොට (2) අනුමත කොට
   (3) අනුකම්පා කොට (4) ප්‍රශංසා කොට

4. සෑම පදයක ම සන්ධ්‍යක්ෂරයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
   (1) වනෞෂධ, නෛතික, නිර්නාමික, ප්‍රත්‍යන්ත
   (2) වෛද්‍යොපදේශ, වානප්‍රස්ථ, සෞන්දර්ය, මහේශ්වර
   (3) මහෞෂධ, මහේශාඛ්‍ය, සහෝදර, මොහොර
   (4) ලෝකෝපකාරය, මහෝත්සවය, ලෞකික, ඓරාවණ

5. **පහත දැක්වෙන පදවල මුල් අකුරෙහි පිළිවෙළින් ඇලපිල්ල, ගැට ඇලපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, ඇදය යෙදී ඇති වරණය තෝරන්න.**
   (1) ප්‍රාර්ථනා, ඖචිත්‍ය, රූපණ, රැහැණි (2) වාගීශ්වර, ශෘංගාර, පීඨිකා, රූකවරණ
   (3) වෘශ්චික, දෙරණ, භීෂණ, රුවනාර (4) දාර්ශනික, දෘඪාංග, භික්ෂාටන, ශ්‍රැතිය

6. පහත දැක්වෙන පදවල අවසාන අකුර කණ්ඨජ, ඕෂ්ඨජ, මූර්ධජ, දන්තජ වශයෙන් පිළිවෙළින් යෙදී ඇති වරණය කුමක් ද?
   (1) භාණක, භස්ම, භක්ෂණ, භග්න (2) වාරික, වාණිජ, වාරණ, වාමන
   (3) නිසග, නිපුණ, නිමේෂ, නිගමන (4) දුර්මුඛ, දුෂ්කර, දුර්වල, දුර්ජන

7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
   (1) අද්‍යතන, පුරාතන, මධ්‍යතන, චිරන්තන (2) අයෝමය, වජ්‍රමය, ස්වර්ණමය, රජතමය
   (3) පෙරයම, මැදියම, පැසුළුයම, අලුයම (4) ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) කනිෂ්ඨ, වර්ථමාන, කෘත්‍රිම, විමර්ශනය (2) ලේඛනය, වාර්තාව, ගනුදෙනු, බොල්පිති

(3) ශිෂ්ඨාචාරය, ප්‍රවෘර්ති, ප්‍රවීණ, ප්‍රත්‍යක්ෂ (4) කඩුළු, මද්‍යසාර, සම්භාෂණ, විරෝධාර

9. පහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත ක්‍රියා පදවල ධාතු ප්‍රකෘති නිවැරදි ව පිළිවෙළින් දැක්වෙන පද පේළිය තෝරන්න.

**හමන** මද පවනින් බෝධි ශාඛාව සෙමින් සෙමින් **සැලෙන්නේ** නෙත සිත **සනසාලමින්** සුදෝසුදු පැහැයෙන් **බබළමින්** විරාජමාන වන චෛත්‍ය රාජයාණන් වහන්සේට පවන් සලන්නා සේ ය.

(1) හමන, සලන, සනස, බබුළ (2) හමන්, සල, සනස්, බබළා

(3) හම, සල, සනස, බබළ (4) හමා, සලා, සනසා, බබළන

10. ඒකවචන උක්ත පද දෙකක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) දෛවඥයෙක්, ගැබිනියක, තිළියක්, සමහරු

(2) රටවාසීහු, ක්‍රීඩකයා, දේශපාලනඥයන්, ලේඛකයකු

(3) අධ්‍යක්ෂවරයා, නිවේදිකාවක, විචාරකයෝ, සංචාරකයකු

(4) ආධුනිකයෙක්, විදේශිකයන්, නියමුවෙකු, නාවිකයෝ

11. මුලින් දැක්වෙන සන්ධි වර්ගවලට ගැළපෙන නිදසුන් පමණක් ඇති වරණය කුමක් ද?

(1) පරස්වර ලෝප සන්ධිය - සුරඟන, යතිඳු, සුරත, ඇවර

(2) පර රූප සන්ධිය - පෙස්සම, දුප්පත්, අග්ගලා, වප්පිහිය

(3) ද්විත්ව රූප සන්ධිය - මල්ලිත්ත, වත්තල, ගොක්කත්ත, රුක්කත්තන

(4) ආගම සන්ධිය - නිරතුරු, දෙයාකාර, බුත්සරණ, දඩයම්

12. පහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති රූප අනුපිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරන්න.

**වෙළෙඳ මධ්‍යස්ථානයෙහි** අලෙවියට තබා ඇති **කෘෂි නිෂ්පාදන** බොහෝ දුරට **වසවිෂවලින්** තොර බව **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** සහතික කොට ඇත.

(1) ආධාර විභක්ති, කර්ම විභක්ති, අවධි විභක්ති, ප්‍රථමා විභක්ති

(2). අවධි විභක්ති, ප්‍රථමා විභක්ති, ආධාර විභක්ති, කර්ම විභක්ති

(3) කර්ම විභක්ති, ආධාර විභක්ති, අවධි විභක්ති, ප්‍රථමා විභක්ති

(4) ආධාර විභක්ති, ප්‍රථමා විභක්ති, අවධි විභක්ති, කර්ම විභක්ති

13. විභක්ති සමාසය. විශේෂණ සමාසය, අන්‍යාර්ථ සමාසය, දකාරාර්ථ සමාසය පිළිවෙළින් යෙදුණු පද පේළිය තෝරන්න.

(1) පොල්තෙල්, පන්සිල්, මින්දද, කිරිබත් (2) බුදුබණ, අකුසල්, සහසැස්, නීතිරීති

(3) සතුරුබිය, මහඇමති, සියපත්, තුරුලිය (4) මල්කරු, නෙතුපුල්, සෙල්ලිපි, නෙත්සිත්

14. තද්ධිත නාමයක් ඇතුළත් නොවන වාක්‍යය තෝරන්න.

(1) මෙරට ඉතිහාසයෙහි පොල්ගස ජනප්‍රිය වෘක්ෂය ව පැවති බව ලිඛිත සාක්ෂ්‍ය විමර්ශනය කිරීමේදී පෙනීයයි.

(2) තම කෘෂි කටයුතු සඳහා මහෝපකාරී වූ සූර්යයාට කෘතගුණ සලකනුවස් හින්දූන් විසින් වාර්ෂික ව තෛපොංගල් උත්සවය පවත්වනු ලබයි.

(3) සමාජයෙහිත්, සංස්කෘතියෙහිත් පැවැත්මට හේතු වන එක් මූලික අංගයක් වන්නේ භාෂාවයි.

(4) කැණීම්වලින් මතු වූ සෙල්මුවා බුදු පිළිමය අනුරාධපුර යුගයට අයත් බව පුරාවිද්‍යාඥයෝ පවසති.

15. පහත සඳහන් වාක්‍ය අතරින් නිපාත පද තුනක් සහිත වාක්‍යය තෝරන්න.

(1) ජයග්‍රහණයට වාසනාව පමණක් ම නොව උත්සාහය ද පදනම් වෙයි.

(2) සරච්චන්ද්‍රයෝ ලාංකේය අනන්‍යතාවක් සහිත නාට්‍ය කලාවක් නිපදවා ගැනීම වෙනුවෙන් නිරන්තරයෙන් වෙහෙස ගත් අයෙකි.

(3) සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුශලතා ඵලදායි ලෙස යොදා ගැනේ.

(4) "ලොවින් එකෙක් එක් දෙයකට වෙයි සමත" යන කියමන මහගමසේකර මහතා උදෙසා අදාළ නොවන්නේ ඔහු විවිධ කලාවන්හි නිපුණ ප්‍රතිභාපූර්ණ ප්‍රබුද්ධ කලාකරුවෙකු හෙයිනි.

16. පරිගණකයේ සම්ප්‍රාප්තියත් සමග යතුරු ලියනයට මිනිසුන් දැක්වූ ඇඩි සැලකිල්ල ක්‍රමයෙන් ගිලිහුණු බව පැහැදිලි ය.

ඉහත වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත කෘදන්ත වර්ග පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කර්මකාරක කෘදන්ත, භාවකාරක කෘදන්ත, කර්තෘකාරක කෘදන්ත, කරණකාරක කෘදන්ත

(2) කරණකාරක කෘදන්ත, භාවකාරක කෘදන්ත, කර්තෘකාරක කෘදන්ත, කර්මකාරක කෘදන්ත

(3) කර්තෘකාරක කෘදන්ත, කරණකාරක කෘදන්ත, කර්මකාරක කෘදන්ත, භාවකාරක කෘදන්ත

(4) කරණකාරක කෘදන්ත, කර්තෘකාරක කෘදන්ත, භාවකාරක කෘදන්ත, කර්මකාරක කෘදන්ත

17. පන්තියේ ඝෝෂා කරමින් සිටි ශිෂ්‍යයන් සංසුන් කරනු පිණිස ගුරුවරයා ගද්‍ය ඡේදයක් දී එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් වන සේ සාරාංශ කරන්නැයි පවසා ඊළඟ පන්තියට ගියේය.

ඉහත වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත ක්‍රියා පද වර්ග පිළිවෙළින් දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධාන ක්‍රියා

(2) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අපර ක්‍රියා, විධාන ක්‍රියා

(3) විධාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා, පූර්ව ක්‍රියා

(4) මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධාන ක්‍රියා

18. පහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණ අංග පිළිවෙළින් දැක්වෙන පද පේළිය තෝරන්න.

පාසල ඉදිරිපිට ආරක්ෂක ප්‍රාකාරය පාසලේ සිසුන් ලවා සිතුවම් කරවීම සුදුසු බවට යෝජනාවක් රැස්වීමේ දී දෙමව්පියන් විසින් ඉදිරිපත් කරන ලදි.

(1) උක්ත කර්මය, අනුක්ත කර්තෘ, අනුක්ත කර්මය, ප්‍රයෝජක කර්තෘ

(2) අනුක්ත කර්මය, ප්‍රයෝජක කර්තෘ, උක්ත කර්මය, අනුක්ත කර්තෘ

(3) අනුක්ත කර්මය, ප්‍රයෝජක කර්තෘ, අනුක්ත කර්තෘ, උක්ත කර්මය

(4) අනුක්ත කර්තෘ, ප්‍රයෝජක කර්තෘ, උක්ත කර්මය, අනුක්ත කර්මය

19. විද්‍යාඥයෝ කොවිඩ් 19 වෛරස මර්දන එන්නතක් නිපදවීමට පර්යේෂණ පවත්වති.

ඉහත වාක්‍යය කර්මකාරකයට හැර වූ විට නිවැරදි වාක්‍යය වන්නේ කුමක් ද?

(1) විද්‍යාඥයෝ විසින් කොවිඩ් 19 වෛරස මර්දන එන්නතක් නිපදවීමට පර්යේෂණ පවත්වනු ලබයි.

(2) විද්‍යාඥයන් විසින් කොවිඩ් 19 වෛරස මර්දන එන්නතක් නිපදවීමට පර්යේෂණ පවත්වති.

(3) විද්‍යාඥයන් විසින් කොවිඩ් 19 වෛරස මර්දන එන්නතක් නිපදවීමට පර්යේෂණ පවත්වනු ලබයි.

(4) විද්‍යාඥයෝ විසින් කොවිඩ් 19 වෛරස මර්දන එන්නතක් නිපදවීමට පර්යේෂණ පවත්වනු ලබති.

20. පහත දැක්වෙන ගීත ඛණ්ඩයන්හි තද කළු අකුරින් මුද්‍රිත පද ව්‍යාකරණානුකූල ව හැඳින්වෙන නම් පිළිවෙළින් යෙදී ඇති වරණය කුමක් ද?

- දැතේ කරගැට සිඹ සනසන්නට ළා ගොයමේ දලු පවන් සලයි
- සින්ධූපමාන වැව් තලා මතින් ඇදී පද්ම රේණුයෙන් සුගන්ධ වී
- සුදු සඳ එළියේ නල මත පොපියන හිරිමල් කැකුළක රොන් කෙමියේ
- ගඟුලේ ගිලීලා ටිකිරිමලී නාලා වගේ

(1) ආඛ්‍යාත, සන්ධි, කෘදන්ත, නිපාත (2) ආඛ්‍යාත, කෘදන්ත, සන්ධි, නිපාත

(3) කෘදන්ත, සන්ධි, නිපාත, ආඛ්‍යාත (4) කෘදන්ත, ආඛ්‍යාත, සන්ධි, නිපාත

21. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අනුස්වාරය හා විසර්ගය ස්වරයකට පූර්වයෙන් යෙදේ.

(2) 'එක්' යනු ස්ත්‍රී ලිංග අනියමාර්ථ ප්‍රත්‍යයකි.

(3) ප්‍රාර්ථනා ආඛ්‍යාතය අතීත කාලයෙහි ද වරනැගේ.

(4) නිපාත හා උපසර්ග වරනොනැගෙන පදයි.

- අංක **22** සිට **24** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

22. කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම සඳහා කැප වී ක්‍රියා කළ සේවකයන්ට ........... දීමනාවක් ලැබුණි.

(1) පාරිභෝගික (2) පාරිභාෂික (3) පාරිතෝෂික (4) පාරිසරික

23. අනතුරට මුහුණ පෑ මගියා සැත්කමක් සඳහා ........... යොමු කරන ලදී.

(1) චිකිත්සාගාරයට (2) ශල්‍යාගාරයට (3) සූතිකාගාරයට (4) ආදාහනාගාරයට

24. යම් කාර්යයක සාර්ථකත්වය උදෙසා නිරන්තර ........... අත්‍යවශ්‍ය වේ.

(1) අධීක්ෂණය (2) අධ්‍යක්ෂණය (3) ආකර්ෂණය (4) ආවර්ජනය

- අංක **25** සහ **26** ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

25. (1) නාහිමියන් රැස්විමේ මුලසුන හෙබවූහ.

(2) මාධ්‍යවේදීන් සත්‍යය ම හෙළි කරතැයි අපි නොසිතමු.

(3) ආධුනිකයන් විශාල පිරිසක් පුහුණුවට සහභාගි වූහ.

(4) සියලු ම ප්‍රබන්ධ රචකයන් භාෂා විශාරදයෝ නොවෙති.

26. (1) ගීත රචකයකු ද, සංගීතඥයකු ද ත්‍යාග ප්‍රදානෝත්සවයට ආරාධනා ලැබ සිටියහ.

(2) සභාපතිවරයා නොහොත් උපසභාපතිවරයා පිළිගැනීමේ කතාව පවත්වති.

(3) ගොවියා දරුවන් ද සමග කුඹුරට යති.

(4) නාට්‍ය අධ්‍යක්ෂවරයා විසින් නැටුම් උළෙල සංවිධානය කරන ලදී.

- අංක **27** සහ **28** ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථ නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

27. ගංවතුරින් අනාථ වූවන්ට සහනාධාර නොසපයන ලදැයි යන්න **ප්‍රතිෂ්ඨා විරහිත** චෝදනාවකි.

(1) විශ්වාස කළ නොහැකි (2) පිළිගැනීමක් නැති

(3) හේතූන් නැති (4) අනුකම්පා විරහිත

28. ප්‍රව්‍රජ්‍යාවෙන් පසු පන්සාලිස් වසක් මුළුල්ලෙහි නාහිමියන් කරන ලද සේවාව වෙනුවෙන් උපහාර දැක්වීම සඳහා මෙම උත්සවය සංවිධානය කරන ලදි.
(1) පනස් පස් (2) හතළිස් පස් (3) පනස් හතර (4) හතළිස් හතර

● අංක **29** සහ **30** යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස තෝරන්න.

29. අබරා සිල් ගත්තා වගේ
(1) උපදෙස් මැනවින් පිළිපැදීම
(2) සිල් ගැනීම පහසු කටයුත්තකි
(3) අවබෝධයෙන් තොර ව යමක් කිරීම
(4) අබරාට වුව ද සිල් රැකිය හැකි බව

30. දොඩම් ගොඩ බදා ගත්ත වගේ
(1) කොතෙක් වෙහෙස වුව ද ප්‍රතිඵලයක් නොලැබීම
(2) නිකම් ලැබෙනව නම් දොඩම් වුවත් හොඳයි
(3) මිල අඩු කාලෙට වැඩි ප්‍රමාණයක් ගැනීම
(4) මහත් ලාබයක් හිමි කර ගැනීම

31. "වෙච්ච දේට මක්කොරන්ට ද දැන් ඉතින් අත් අඳෝමයි කියල වැඩක් ඇතෑ"
ඉහත ප්‍රකාශය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වාක්‍යය වන්නේ කුමක් ද?
(1) සිදු වූ දෙයට කුමක් කළ යුතු දැයි සිතමින් කනගාටු වීම පලක් නැති දෙයකි.
(2) සිදු වූ දෙයට කුමක් කරන්න ද දැන් එයට කනගාටු වී පලක් ඇද් ද?
(3) සිදු වූ දෙයට කනගාටු වීම හැර පලක් ඇති දෙයක් තිබේ ද?
(4) සිදු වූ දෙයට කුමක් කරම් දැයි කනගාටු වීම පලක් ඇති දෙයකි.

32. එකිනෙකට අනුරූප ලෙස වචන යුගල යෙදී ඇති පද පේළිය කුමක් ද?
(1) අන්වර්ථ නම්, නාම පුවරුව, ජලචර පක්ෂීන්, දිව්‍ය ලෝකය
(2) ශිලා ලේඛන, කවි ලකර, දෝ සතර, නිරවද්‍ය උච්චාරණය
(3) කඨින සිවුර, මාතෘ භාෂා, පාලි බස, වංස කථා
(4) සාහිත්‍ය ග්‍රන්ථ, ඝණ්ඨා නද, ජන්ම භූමිය, ධෛර්යවත් කත

33. මුලින් දී ඇති පදයට සමාන අර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) ප්‍රවීණ - දක්ෂ, නිපුණ, ප්‍රබල, ශූර
(2) ශීර්ෂය - හිස, සිරස, මස්තකය, උතුමග
(3) චංචල - සල, සසල, ලෙළ, සන්සල
(4) ආරාමය - අරම, අසපුව, ආශ්‍රමය, පන්සල

34. මේ අතුරින් විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ කුමක් ද?
(1) උත්තම - අධම (2) සංක්ෂේප - විස්තාරණ
(3) තත්ත්වාවබෝධය - තත්ත්වාරෝපණය (4) ශුක්ල පක්ෂය - කෘෂ්ණ පක්ෂය

35. යුගල පදයක් ඇතුළත් නොවන පද පේළිය කුමක් ද?
(1) අවුල්වියවුල්, අරුම්පුදුම, අණපනත්, අඟරදඟර
(2) හොරමැර, හුරුබුහුටි, හරබර, සටකපට
(3) ඇඟපත, සඟගණ, ඇදකුද, ළඳබොළඳ
(4) යානවාහන, යනඑන, බාලමහලු, වගතුග

36. සාර පලය අඹ දඹ රඹ ද වල් පිට
මීර ජලය ඇළ දොළ කඳු පිටින් බට
නෑර ලොලය වඩවන දුටු දනන් හට
කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට

මේ කවියෙන් දැක්වෙන්නේ,

(1) උපමාලංකාරයකි. (2) රූපකාලංකාරයකි.
(3) අතිශයෝක්ති අලංකාරයකි. (4) ස්වභාවෝක්ති අලංකාරයකි.

37. වර්ණිත වස්තුවට හෝ අවස්ථාවට අනුගත ව අර්ථ රසයට බාධාවක් නොවන සේ සමාන ශබ්ද සහිත අකුරු හා පද නැවත නැවත යෙදීමෙන් මතු කරනු ලබන්නේ,

(1) විරිතයි. (2) අනුප්‍රාසයයි. (3) රිද්මයයි. (4) එළිසමයයි.

38.

| | |
|---|---|
| පූජාවලිය | *A* – සකල විද්‍යා චක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිත |
| සද්ධර්මරත්නාවලිය | *B* – ධර්මසේන හිමි |
| සිංහල ථූපවංසය | *C* – කවීශ්වර පණ්ඩිත |
| මයුර සන්දේශය | *D* – මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි |

ඉහත කෘති හතරෙහි කර්තෘත්ව අනුපිළිවෙළ විය යුත්තේ කුමක් ද?

(1) *D, B, A, C* (2) *B, D, C, A* (3) *B, A, C, D* (4) *B, C, D, A*

39. රිවි බිම්බා යුරු රිවිකුල කමලකර
පියුමම්බා නිතොර ව ඇඳි උරමැදුර
මෙනරම්බා හිමි රූ සිරිනි මනහර
පැරකුම්බා නරනිඳු සඳ දකු මිතුර

ඉහත පද්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත කාව්‍යෝපක්‍රම හැඳින්වෙන නම් අනුපිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?

(1) උපමා, රූපක, රූපක, උපමා (2) රූපක, උපමා, රූපක, උපමා
(3) රූපක, උපමා, උපමා, රූපක (4) උපමා, රූපක, උපමා, රූපක

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන නිවැරදි වාක්‍යය තෝරන්න.

සාහිත්‍ය කලා නිර්මාණයකින් සිදු කෙරෙන්නේ නිර්මාණකරුවා අත්විඳි හැඟීම් හා සමාන මානසික තත්ත්වයන් ඒ නිර්මාණය ආස්වාදනය කරන්නාගේ මනසෙහි ද ජනිත කිරීම යි.

(1) සාහිත්‍ය කලා නිර්මාණයකින් නිර්මාණකරුවා අත්විඳි හැඟීම් හා මානසික තත්ත්වයන් රසිකයාගේ මනසෙහි ද නිර්මාණය කිරීම සාහිත්‍යයේ කාර්යය යි.
(2) නිර්මාණකරුවා කලා නිර්මාණයකින් සිය හැඟීම් හා සමාන මානසික තත්ත්වය රසිකයාගේ මනසෙහි ද ජනිත කොට සාහිත්‍ය කලාව නිර්මාණය කරයි.
(3) නිර්මාණකරුවා සිදු කරන්නේ තමාගේ හැඟීම් හා මානසික තත්ත්වයන් රසිකයාගේ මනසෙහි ද ජනිත කොට සාහිත්‍ය කලාවක් නිර්මාණය කිරීම ය.
(4) නිර්මාණකරුවා අත්විඳි හැඟීම් හා සමාන මානසික තත්ත්වයන් රසිකයාගේ මනසෙහි ද ජනිත කිරීම සාහිත්‍ය කලා නිර්මාණයකින් සිදු වේ.


**

**2.3 I ප්‍රශ්න පත්‍රයේ I කොටස සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 1 | 21. | 4 |
| 02. | 3 | 22. | 3 |
| 03. | 2 | 23. | 2 |
| 04. | 3 | 24. | 1 |
| 05. | 2 | 25. | 2 |
| 06. | 1 | 26. | 4 |
| 07. | 4 | 27. | 3 |
| 08. | 2 | 28. | 2 |
| 09. | 3 | 29. | 3 |
| 10. | 1 | 30. | 1 |
| 11. | 2 | 31. | 2 |
| 12. | 1 | 32. | 2 |
| 13. | 3 | 33. | 1 |
| 14. | 1 | 34. | 3 |
| 15. | 2 | 35. | 3 |
| 16. | 4 | 36. | 4 |
| 17. | 4 | 37. | 2 |
| 18. | 2 | 38. | 1 |
| 19. | 3 | 39. | 1 |
| 20. | 1 | 40. | 4 |

වගුව **2.1**
**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 කි.**

## 2.4 I ප්‍රශ්න පත්‍රයෙහි I කොටස සඳහා සාධනය




ප්‍රස්තාරය 2.1 (RD/16/5/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

අපේක්ෂකයන් වැඩි ම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර සපයා ඇති 1 ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.94කි. එනම් 1 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 94%ක් නිවැරදි පිළිතුර සපයා ඇති අතර ඒ අනුව ප්‍රශ්නයේ පහසුතාව 94%කි.

## 2.5 I ප්‍රශ්න පත්‍රයේ I කොටසේ වරණ තෝරාගෙන ඇති ආකාරය (ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තේරූ ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමුවන වරණය | දෙවන වරණය | තෙවන වරණය | සිව්වන වරණය | ප්‍රතිචාර නොදැක්වූ |
| 1 | 1 | 94.24 | 0.88 | 3.36 | 1.2 | 0.32 |
| 2 | 3 | 6.16 | 8.96 | 74.8 | 9.68 | 0.4 |
| 3 | 2 | 14.08 | 51.84 | 13.84 | 19.76 | 0.48 |
| 4 | 3 | 9.2 | 21.52 | 30.96 | 37.12 | 1.2 |
| 5 | 2 | 5.28 | 84.08 | 4.72 | 5.6 | 0.32 |
| 6 | 1 | 53.12 | 23.04 | 10.88 | 11.92 | 1.04 |
| 7 | 4 | 30.08 | 8.96 | 7.36 | 52.72 | 0.88 |
| 8 | 2 | 15.2 | 25.76 | 27.36 | 31.2 | 0.48 |
| 9 | 3 | 12.56 | 12.16 | 57.84 | 16.8 | 0.64 |
| 10 | 1 | 44 | 14.56 | 25.2 | 15.68 | 0.56 |
| 11 | 2 | 27.12 | 19.36 | 44.16 | 8.8 | 0.56 |
| 12 | 1 | 36.88 | 19.28 | 19.92 | 23.04 | 0.88 |
| 13 | 3 | 19.04 | 30.48 | 35.76 | 13.92 | 0.8 |
| 14 | 1 | 22.96 | 21.52 | 34.88 | 19.68 | 0.96 |
| 15 | 2 | 29.2 | 19.12 | 19.12 | 31.68 | 0.88 |
| 16 | 4 | 22.56 | 27.12 | 30.72 | 18.72 | 0.88 |
| 17 | 4 | 16 | 33.6 | 13.52 | 36.48 | 0.4 |
| 18 | 2 | 23.6 | 36.48 | 25.2 | 14.16 | 0.56 |
| 19 | 3 | 14.32 | 16.16 | 38.88 | 30.24 | 0.4 |
| 20 | 1 | 49.52 | 20 | 18.16 | 11.6 | 0.72 |
| 21 | 4 | 16.48 | 12 | 15.12 | 55.44 | 0.96 |
| 22 | 3 | 57.12 | 9.76 | 25.52 | 6.72 | 0.88 |
| 23 | 2 | 6.96 | 86.96 | 4.88 | 0.88 | 0.32 |
| 24 | 1 | 74.16 | 10.8 | 6.56 | 8.16 | 0.32 |
| 25 | 2 | 23.76 | 26.8 | 27.44 | 21.44 | 0.56 |
| 26 | 4 | 13.2 | 13.36 | 27.68 | 45.04 | 0.72 |
| 27 | 3 | 46.32 | 16.72 | 14.64 | 21.52 | 0.8 |
| 28 | 2 | 17.28 | 53.2 | 25.84 | 3.2 | 0.48 |
| 29 | 3 | 13.28 | 6 | 71.92 | 8.32 | 0.48 |
| 30 | 1 | 49.36 | 9.92 | 17.2 | 22.72 | 0.8 |
| 31 | 2 | 38.64 | 47.92 | 8 | 4.72 | 0.72 |
| 32 | 2 | 13.84 | 28.24 | 39.76 | 17.04 | 1.12 |
| 33 | 1 | 14.4 | 47.52 | 25.44 | 11.92 | 0.72 |
| 34 | 3 | 18.08 | 24.16 | 40.72 | 16.08 | 0.96 |
| 35 | 3 | 27.12 | 29.04 | 30 | 12.8 | 1.04 |
| 36 | 4 | 19.44 | 18.08 | 11.68 | 50.08 | 0.72 |
| 37 | 2 | 17.76 | 31.36 | 24 | 26.32 | 0.56 |
| 38 | 1 | 64.96 | 12.24 | 15.2 | 7.12 | 0.48 |
| 39 | 1 | 27.52 | 26.08 | 23.6 | 21.84 | 0.96 |
| 40 | 4 | 23.84 | 23.92 | 20.64 | 31.04 | 0.56 |

වගුව **2.2**


එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත. ප්‍රතිචාර නොදැක්වූ තීරයේ දක්වා ඇත්තේ කිසිදු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතයයි.

**2.6 I ප්‍රශ්න පත්‍රයේ I කොටස සඳහා තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණය**

| තේමාව/ විෂය ක්ෂේත්‍රය | ප්‍රශ්න අංකය |
|---|---|
| භාෂා කුසලතා | 1, 2, 3, 22, 23, 24, 27, 28, 29, 30, 31, 32, 33, 34, 35 |
| ව්‍යාකරණ | 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17, 18, 19, 20, 21, 25, 26 |
| භාෂා සාහිත්‍ය | 36, 37, 38, 39 |
| විශ්ලේෂණය හා අවබෝධය | 40 |

වගුව **2.3**

I ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විතය. ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කරගත් තේමා සංඛ්‍යාව 04කි. ඒ ඒ තේමා අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය ඉහත වගුවේ සඳහන් කර ඇත. එක් එක් තේමාවට අදාළ මාතෘකා හා විෂය කරුණු ප්‍රමාණය අනුව ප්‍රශ්න සංඛ්‍යාව තීරණය කර ඇත. ප්‍රශ්න 40න් 20ක් ව්‍යාකරණ තේමාව යටතේ ද ප්‍රශ්න 15ක් භාෂා කුසලතාව තේමාව යටතේ ද භාෂා සාහිත්‍ය තේමාව යටතේ ප්‍රශ්න 04ක් ද විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතේ ප්‍රශ්නයක් ද ඇතුළත් කර ඇත.





ප්‍රස්තාරය **2.2**

භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න 15 අතුරෙන් පහසුතාව වැඩි ම 1 ප්‍රශ්නයයි. එය I පත්‍රයේ ම පහසු ම ප්‍රශ්නය වේ. I පත්‍රයේ පහසුතාව අඩු ම ප්‍රශ්නය වන්නේ ද භාෂා කුසලතා තේමාව යටතේ ඇති 33 ප්‍රශ්නයයි. එහි පහසුතාව 14%කි. භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් 50%ක් හෝ ඊට

වැඩි පසුතාවක් ඇති ප්‍රශ්න 7කි. එම ප්‍රශ්න වන්නේ 1, 2, 3, 23, 24, 28 හා 29 යන ප්‍රශ්නයි.
ව්‍යාකරණ තේමාව යටතේ ඇති ප්‍රශ්න 20 අතුරෙන් පහසුතාව වැඩි ම ප්‍රශ්නය 5 ප්‍රශ්නයයි. එහි පහසුතාව 84%කි. මෙම තේමාව යටතේ අඩු ම පහසුතාව පෙන්නුම් කරනුයේ 11,15,16 ප්‍රශ්නයි. එම ප්‍රශ්නවල පහසුතාව 19%කි. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් 50%ක් හෝ ඊට වැඩි පහසුතාව පෙන්වන ප්‍රශ්න 5කි. එම ප්‍රශ්න වන්නේ 5, 6, 7, 9, 20 හා 21 යි.

භාෂා සාහිත්‍ය තේමාව යටතේ ප්‍රශ්න 4 අතුරෙන් 38 ප්‍රශ්නයෙහි පහසුතාව 65%කි.




ප්‍රස්තාරය **2 .3**

සිංහල I පත්‍රයෙහි I කොටස සැකසීමේ දී පදනම් කර ගනු ලැබූ තේමා 4 අතුරෙන් එක් එක් තේමාවට අයත් ප්‍රශ්නවල පහසුතාව සලකා එම එක් එක් තේමාවෙහි මධ්‍යක පහසුතාව මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත. ඒ අනුව එම තේමා අතුරෙන් පහසුතාව වැඩි ම තේමාව ව්‍යාකරණ තේමාවයි. ව්‍යාකරණ තේමාව යටතේ I ප්‍රශ්න පත්‍රයෙහි I කොටසේ ප්‍රශ්නවලින් 38%ක් ඉදිරිපත් කර තිබුණි. භාෂා කුසලතා තේමාවෙන් වැඩි ම ප්‍රශ්න ප්‍රතිශතයක් ඉදිරිපත්ව තිබූ අතර එම තේමාවෙහි මධ්‍යක පහසුතාව 39%කි. තේමාවෙන් ඉදිරිපත්ව තිබූ ප්‍රශ්න ප්‍රතිශතය 50%කි.

| ප්‍රශ්න අංකය | විෂය ක්ෂේත්‍රය | පහසුතාව වැඩි ම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩු ම ප්‍රශ්නය හා එහි පහසුතාව | ප්‍රශ්නවල සමස්ත පහසුතාව |
|---|---|---|---|---|
| 1<br>33 | භාෂා කුසලතාව | 1 (94%) | 33 (14%) | 45% |
| 5<br>16 | ව්‍යාකරණ | 5 (84%) | 11,15,16<br>(19%) | 39% |
| 38<br>39 | භාෂා සාහිත්‍යය | 38 (65%) | 39 (28%) | 44% |
| 40 | විශ්ලේෂණය හා අවබෝධය | 31.04 | | |

වගුව **2.4**

## 2.7 I පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව පිළිබඳ අපේක්ෂකයන් සතු නිරවුල් දැනුම, ස්මරණ ශක්‍යතාව, භාෂා පරිචය හා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂිත ය.

මෙම බහුවරණ ප්‍රශ්න හතළිහට ම ඒ සඳහා විශේෂයෙන් සැකසුණු ආකෘතියක පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල I පත්‍රයට හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I පත්‍රයේ I කොටසෙහි ප්‍රශ්න හතළිහට පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත් පැය එකක කාලයක් ඒ සඳහා යෙදවීම ප්‍රමාණවත් යැයි අපේක්ෂා කෙරේ.

**භාෂා කුසලතා**

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු බහුවරණ ප්‍රශ්න 40 අතුරෙන් ප්‍රශ්න 15ක් භාෂා කුසලතා තේමාවෙන් ඉදිරිපත් කර ඇත. I පත්‍රයට හිමි ලකුණුවලින් 35%ක් මේ සඳහා වෙන් කෙරෙන ලෙස තේමා අතර බර තබා ඇත. බහුවරණ ප්‍රශ්න 40න් පහසු ම ප්‍රශ්නය වූ පළමුවන ප්‍රශ්නය භාෂා කුසලතා තේමාවට අයත් වේ. එහි පහසුතාව 94%කි. පහසුතා දර්ශකයේ දෙවන වැඩි ම අගය පෙන්නුම් කරන්නේ ද භාෂා කුසලතාවට අයත් 23 ප්‍රශ්නයයි. එහි පහසුතාව 87%කි. ප්‍රශ්න 40 අතුරෙන් ඉහළම පහසුතාව මෙම ප්‍රශ්න දෙක පෙන්නුම් කර ඇත. අඩු ම පහසුතාව පෙන්නුම් කර ඇත්තේ ද භාෂා කුසලතාව තේමාවට අයත් අංක 27 හා 33 යන ප්‍රශ්නයි. එවායේ පහසුතාව පිළිවෙළින් 15%ක් හා 14%ක් වේ. භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක 33 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය අවම වී ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර ඇතුළත් පළමුවන වරණය තෝරා ගෙන ඇත්තේ 14%ක් පමණි. 48% ක් දෙවන වරණය ද 25%ක් තෙවන වරණය ද 12%ක් සිවුවන වරණය ද තෝරා ගෙන ඇත. මුලින් දී ඇති පදයට සමාන අර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරා ගැනීම අපේක්ෂිත වුව ද සමානාර්ථ පද පිළිබඳ පුළුල් අවබෝධයක් අපේක්ෂකයන් සතුව නොතිබූ බව ගම්‍ය වෙයි. එයට හේතු ලෙස පෙළපොත නිසි ලෙස පරිහරණය නොකිරීම හා සතතාභ්‍යාසවල නොයෙදීම දැක්විය හැකි ය.

**ව්‍යාකරණ**

සිංහල I පත්‍රයේ I කොටසෙහි ව්‍යාකරණ තේමාවට බහුවරණ ප්‍රශ්න 20ක් අඩංගු වූ අතර මෙම ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණුවලින් 52.5%ක් එම තේමාවට වෙන් වී තිබුණි. ව්‍යාකරණ තේමාවට අයත් ප්‍රශ්න 20 අතුරෙන් වැඩි ම පහසුතාව පෙන්නුම් කර ඇත්තේ 5 ප්‍රශ්නයයි. එහි පහසුතාව 84%කි. මෙම තේමාව යටතේ ඇති සෙසු පහසු ප්‍රශ්න ලෙස සැලකිය හැකි 6,7,9,21 යන ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 53%, 53%, 58%, 55%ක් වේ.

ව්‍යාකරණ තේමාව යටතේ අපේක්ෂකයන්ට දුෂ්කර ම ප්‍රශ්න වී තිබුණේ 11,15,16 ප්‍රශ්න වේ. එම ප්‍රශ්නවල පහසුතාව 19%කි. මෙම ප්‍රශ්න අතුරෙන් 11 ප්‍රශ්නයෙහි නිවැරදි වරණය වූයේ 2 වරණය වුවත් එය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 19%ක් පමණ වූ අතර අපේක්ෂකයන්ගෙන් 27%ක් පළමු වරණය ද 44%ක් තෙවන වරණය ද 9%ක් සිවුවන වරණය ද තෝරා ගෙන තිබුණි. 15 වන ප්‍රශ්නයේ නිවැරදි වරණය වූයේ දෙවන වරණය වුවත් එය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන් 19%ක් පමණ වූ අතර අපේක්ෂකයන්ගෙන් 29% ක් පළමු වරණය ද 19%ක් තෙවන වරණය ද 32%ක් සිවුවන වරණය ද තෝරා ගෙන තිබුණි. 16 වන ප්‍රශ්නයේ නිවැරදි වරණය වූයේ සිවුවන වරණය වුවත් එය තෝරා ගෙන ඇත්තේ

අපේක්ෂකයන්ගෙන් 19%ක් පමණ වූ අතර අපේක්ෂකයන්ගෙන් 23%ක් පළමු වරණය ද 27%ක් දෙවන වරණය ද 31%ක් තෙවන වරණය ද තෝරා ගෙන තිබුණි.
ව්‍යාකරණාංගවලින් සමන්විත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තේරීම සඳහා ව්‍යාකරණ රීති පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් නොතිබූ බව මෙහි දී කැපී පෙනුණි.
ප්‍රශ්න අංක 8,14,25 ප්‍රශ්න ද අපේක්ෂකයන්ට දුෂ්කර වී ඇති බව පෙනේ. ඒවායේ පහසුතා පිළිවෙළින් 26%, 23%, 27%ක් වේ. සමස්තයක් ලෙස ව්‍යාකරණ තේමාවට අයත් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා ගැනීමේ මධ්‍යක පහසුතාව (Average facility) 39%කි.

**භාෂා සාහිත්‍යය**

සිංහල I පත්‍රයේ I කොටසෙහි ප්‍රශ්න 40 අතුරෙන් මෙම තේමාව ඇසුරෙන් සකස් වී ඇත්තේ ප්‍රශ්න 4ක් පමණි. එනම් 36,37,38 හා 39 ප්‍රශ්න යි. මෙම ප්‍රශ්න 4 අතුරෙන් ඉහළ ම පහසුතාව පෙන්වා තිබුණේ 38වන ප්‍රශ්නය යි. එහි පහසුතාව 65%කි. 36,37,39 ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 50%, 31%, 28% වේ.
පෙළපොතේ ඇතුළත් කාව්‍යාලංකාර හා සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නවලින් විමසා තිබුණි. සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම සඳහා වූ 38 ප්‍රශ්නයට මනා ප්‍රතිචාර ලැබී තිබුණ ද කාව්‍යාලංකාර පිළිබඳ අවබෝධය මඳ වීම සෙසු ප්‍රශ්න සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් ලැබීමට හේතු වී ඇත.
මෙම ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණුවලින් 10%ක් මෙම තේමාවට වෙන් වී තිබූ අතර ඊට අදාළ ප්‍රශ්න හතරෙහි මධ්‍යයක පහසුතාව 44%කි.

**විශ්ලේෂණය හා අවබෝධය**


සිංහල I පත්‍රයේ විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතේ අංක 40 ප්‍රශ්නය වෙන් වී තිබුණි. I පත්‍රයට හිමි ලකුණුවලින් මෙම තේමාව සඳහා 2.5%ක බර තැබීමක් සිදු කර ඇත. එම 40 ප්‍රශ්නයේ පහසුතාව 31%කි. හොඳින් කියවා තේරුම් ගත යුතුව තිබූ එම ප්‍රශ්නයට අඩු පහසුතාවක් ලබා ගැනීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. විශ්ලේෂණ හා අවබෝධතා හැකියාව මැනීමේ ප්‍රශ්නයක් වන මෙහි පහසුතව මෙන් ම මධ්‍යයක පහසුතාව ද 31%කි.

සිංහල I පත්‍රයේ සමස්ත පහසුතාව 44%කි. එනම් මෙම පත්‍රයට පෙනී සිටි අපේක්ෂකයන් සමස්තයක් වශයෙන් ගත් කළ ඔවුන් උපයා ගෙන ඇත්තේ එම පත්‍රයට උපයා ගත හැකිව තිබූ උපරිම ලකුණුවලින් 44%කි. මෙයින් පෙනී යන්නේ මෙම පත්‍රයට ලකුණු ලබා ගැනීම මධ්‍යස්ථ මට්ටමට වඩා අඩුවෙන් පැවති බවයි.

සිංහල I පත්‍රයේ ප්‍රශ්න අංක 1,2,3,5,6,7,9,21,23,24,28,29,36,38 යන ප්‍රශ්න 14 සඳහා ලබා ඇති පහසුතාව 50% ක් හෝ ඊට වැඩි අගයක් ගෙන තිබුණි. එය මුළු ප්‍රශ්න ගණනින් 35% කි. මුළු ප්‍රශ්න ගණනින් 35%ක් සඳහා 50% ට වැඩි පහසුතාවක් ලබා ගැනීම සතුටුදායක තත්ත්වයකි. එම ප්‍රශ්න 14න් 7ක් භාෂා කුසලතා තේමාවට ද 5ක් ව්‍යාකරණ තේමාවට ද 2ක් භාෂා සාහිත්‍ය තේමාවට ද ඇතුළත් වේ. සමස්ත පහසුතාව 44% ක් වීම යම් තරමක සතුටුදායක මට්ටමක් පෙන්නුම් කළ ද සෑහීමකට පත් විය හැකි තත්ත්වයක් නොවේ.
සිංහල භාෂාව ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී භාෂා කුසලතාව හා ව්‍යාකරණ සිද්ධාන්ත ඉගෙනීම සඳහා පෙළපොතට අතිරේකව බාහිර පොතපත පරිශීලනය, භාෂා දින පැවැත්වීම, භාෂාඥානය කුළු ගැන්වීම සඳහා තරග ආදිය පැවැත්වීම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම යෝජනා කෙරේ.

## 2.8 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 2.8.1 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටසෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:


සිංහල I පත්‍රයෙහි II කොටසේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. මෙම ප්‍රස්තාරයට අනුව අංක 1 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර දක්වා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 100%කි. අඩු ම අපේක්ෂකයන් සංඛ්‍යාවක් තෝරා ගෙන ඇත්තේ 5වන ප්‍රශ්නය වන අතර එය ප්‍රතිශතයක් ලෙස 82.5%කි.

ප්‍රස්තාරය 2 .4 (RD/16/03/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)




ප්‍රස්තාරය 2 .5 (RD/16/03/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

## 2.8.2 I ප්‍රශ්න පත්‍රයේ II කොටස සඳහා සාධනය




ප්‍රස්තාරය 2.6 (RD/16/4/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

අපේක්ෂකයන් වැඩි ම පිරිසක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 4(iii) ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0ග72කි. එනම් 4(iii) ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 72%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව ප්‍රශ්නයේ පහසුතාව 72%ක් ලෙස දැක්විය හැකිය. 1(ii) (අ) අනුකොටස සඳහා අපේක්ෂකයන් අවම පිරිසක් සාර්ථකව පිළිතුරු සපයා ඇති අතර එහි පහසුතා දර්ශකය 0.03කි.

## 2.8.3 I ප්‍රශ්න පත්‍රය II කොටස සඳහා එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1 ප්‍රශ්නය

අපේක්ෂණය : භාෂා පරිචය ඇගයීම

ව්‍යූහය : මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනු ප්‍රශ්න 10ක් ඇතුළත් වේ.

1. අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

(i) පහත සඳහන් අක්ෂර ලියා දක්වන්න.

(අ) මූර්ධජ ඌෂ්මාක්ෂරය

(ආ) තාලුජ ඌෂ්මාක්ෂරය

(ii) පහත (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) ජලයෙන් තොර

(ආ) අංග පහකින් යුත්

(iii) පහත සඳහන් පද්‍ය පාඨ දෙකෙහි ඇතුළත් 'අඹ' යන්නෙහි අර්ථ දෙක වෙන වෙන ම ලියන්න.

(අ) කුළින් කුළම සිහිල්'ඹ වැහෙන කඳුරු ය (සිහිල් + අඹ)

(ආ) නිබඳ පැසී පල ලඹ දෙන මිහිර'ඹය (මිහිරි + අඹ)

(iv) (අ) 'පෞරාණික' යන්නෙහි ප්‍රකෘතිය හා තද්ධිත ප්‍රත්‍යය වෙන් කර ලියන්න.

(ආ) සුන්දර + ය ගැළපීමෙන් සැදෙන තද්ධිත පදය කුමක් ද?

(v) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(අ) සම්‍යග්දෘෂ්ටිය

(ආ) අල්පශ්‍රැත

(vi) පහත දක්වා ඇති අනුක්ත පදවල උක්ත රූප ලියන්න.

(අ) මිත්තණියන්

(ආ) නාට්‍යකාංගනාවක

(vii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

සමස්ථ ලංකා මැරතන් ධාවන තරගයේ විශිෂ්ඨ ශූරතාව හිමි කර ගැනීම ඔහුගේ එක ම අභිලාෂය විය,

(viii) පහත සඳහන් කර්තෘකාරක වාක්‍යය කර්මකාරකයටත්, කර්මකාරක වාක්‍යය කර්තෘකාරකයටත් හරවා ලියන්න.

(අ) කාලගුණ විද්‍යාඥයෝ අනාවැකි පළ කරති.

(ආ) නව තානාපතිවරුන් විසින් ජනාධිපතිතුමාට අක්ත පත්‍ර බාර දෙනු ලැබී ය.

(ix) පහත දැක්වෙන යෙදුම්වල පළමු වචනය සහ දෙවන වචනය අතර නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවන වචනය සකස් කර ලියන්න.

(අ) විදෙස් ප්‍රවෘත්ති

(ආ) විහාර මැදුර

(x) පහත සඳහන් පද්‍යාර්ධවල තද කළු අකුරින් මුද්‍රිත පද කවර ක්‍රියා වර්ගයකට අයත් දැයි දක්වන්න.

(අ) කෙළිමින් තැන තැන **ලන්දු**
දෙනමෙන් කන අම **බින්දු**

(ආ) ඇදුර තුටු **නොවෙතියි**
නොසිත අප සිප් **නොදතියි**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| | | | | |
|---|---|---|---|---|
| (i) | (අ) | ෂ | (ආ) | ශ |
| (ii) | (අ) | නිරුදක | (ආ) | පඤ්චාංග/පසඟ |
| (iii) | (අ) | ජලය | (ආ) | අඹ (පලතුර) |
| (iv) | (අ) | පුරාණ + ඉක | (ආ) | සෞන්දර්ය/ සෞන්දර්‍ය |
| (v) | (අ) | මිථ්‍යාදෘෂ්ටි | (ආ) | බහුශ්‍රැත |
| (vi) | (අ) | මිත්තණියෝ | (ආ) | නාටිකාංගනාවක් |
| (vii) | (අ) | සමස්ත | (ආ) | විශිෂ්ට |

(viii) (අ) කාලගුණ විද්‍යාඥයන් විසින් අනාවැකි පළ කරනු ලැබේ/ කරනු ලබයි/ කෙරේ/ කෙරෙයි
(ආ) නව තානාපතිවරු ජනාධිපතිතුමාට අක්ත පත්‍ර භාර දුන්හ

(ix) (අ) විදේශ ප්‍රවෘත්ති/ විදෙස් පුවත්
(ආ) විහාර මන්දිරය/ වෙහෙර මැඳුර


(x) (අ) මිශ්‍ර ක්‍රියා/ මුසු කිරිය
(ආ) විධාන ක්‍රියා/ විධි ක්‍රියා/ විදිකිරිය

**(ලකුණු 02 × 10)**

**(ලකුණු 20යි.)**

**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**

**1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය**





මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. අපේක්ෂකයන් 100%ක් ම මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණි. මෙම ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 46% ක් ද,
6 - 10 ප්‍රාන්තරයේ 39% ක් ද,
11 – 15 ප්‍රාන්තරයේ 12% ක් ද,
16 - 20 ප්‍රාන්තරයේ 03% ක් ද,

වශයෙන් ලකුණු ලබා ගෙන ඇත.

ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 3%ක් වන අතර 46%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩු ප්‍රමාණයකි.




■ සිංහල I පත්‍රයේ II කොටසෙහි පළමුවන ප්‍රශ්නය කොටස් 10ක් යටතේ අනුකොටස් 20කින් සමන්විත වේ. වැඩි ම පහසුතාව III (ආ) අනුකොටස වන අතර එහි පහසුතාව 59%කි. මෙම ප්‍රශ්නයෙන් මැනෙන්නේ භාෂා භාවිතය පිළිබඳ පරිචයයි. එහි දී 'අඹ' යන පදය වාක්‍ය දෙකෙහි යෙදී ඇති ආකාරය අනුව අදහස නිවැරදි ව දැක්වීමට අපේක්ෂකයන්ගෙන් අඩකට මදක් වැඩි ප්‍රමාණයක් සමත් වී ඇත.

■ දෙවන වැඩි පහසුතාව වන 49% පෙන්නුම් කර ඇත්තේ ix කොටසේ (අ) අනුකොටසට ය. තත්සම තත්භව භාවිතය පිළිබඳව මෙම ප්‍රශ්නයේ අනුකොටස් දෙකෙන් ම විමසා ඇති අතර නිතර භාවිතයේ පවත්නා පද පිළිබඳ ව විමසා ඇති බැවින් එම ප්‍රශ්නය පහසු වී ඇති බව පෙනේ.

■ තෙවන වැඩිම පහසුතාව x (අ) අනුකොටස වන අතර එහි පහසුතාව 44%කි. ක්‍රියා ප්‍රවර්ගය විමසන ප්‍රශ්නයකි. මිශ්‍ර ක්‍රියා පදය හඳුනා ගැනීමට අපේක්ෂකයන්ගෙන් අඩකට අඩු පිරිසක් සමත් වී ඇත.

■ i (අ) (ආ) ii (ආ) iv (ආ) v (ආ) vi (අ) (ආ) vii පළමු කොටස හා ix (ආ) යන කොටස්වල/ අනුකොටස්වල පහසුතාව 30%-40% ප්‍රාන්තරය අතර පවතී. මෙම අනුකොටස් 20 අතුරෙන් දුෂ්කරම වී ඇත්තේ ii (අ) iii (අ) viii (ආ) අනුකොටස් ය. එම අනුකොටස්වල පහසුතාව පිළිවෙළින් 3%,9%,7%ක් වේ. ඒ අනුව ii (අ) නිපාත පද පිළිබඳ අවබෝධයත් iii (අ) අනුකොටසින් භාෂා හැකියාව පිළිබඳ අවබෝධයත් viii (ආ) අනුකොටසින් කතෘකාරක හා කර්මකාරක වාක්‍ය පිළිබඳ අවබෝධයත් මැනෙන අතර ඒ පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් අපේක්ෂකයන් සතුව නොතිබීම ඉහත අනුකොටස්වලට සාර්ථක ව පිළිතුරු සැපයීමට අපේක්ෂකයන් අපොහොසත් වීමට හේතු ලෙස අවධාරණය කළ හැකිය.

■ අනතුරුව වඩාත් දුෂ්කර වී ඇත්තේ x (ආ) අනුකොටස යි. එහි පහසුතාව 13%කි. එහි (අ) අනු කොටසේ පහසුතාව 44%කි. එම අනුකොටස් දෙකෙන් ම මැනෙනුයේ ක්‍රියා ප්‍රවර්ග පිළිබඳ නිරවුල් අවබෝධයයි. ඒ අනුව ක්‍රියා ප්‍රවර්ග පිළිබඳ අවබෝධය දුර්වල මට්ටමක පවතින බව අනාවරණය විය.

■ iv කොටසේ අනුකොටස් දෙක ම තද්ධිත පද පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න වන අතර එහි (අ) සහ (ආ) අනුකොටස් සඳහා පිළිවෙළින් 20% හා 30%ක පහසුතාව පෙන්නුම් කරයි. එමෙන් ම v කොටසේ (අ) අනුකොටස ද අඩු පහසුතාවක් පෙන්නුම් කරන ප්‍රශ්නයකි. විරුද්ධාර්ථ පද පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම මෙහි දී මැන බැලෙන අතර එහි පහසුතාව 28%කි.

2 ප්‍රශ්නය

අපේක්ෂණය : සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැනීම

ව්‍යූහය : මාර්ගෝපදේශිත රචන මූලධර්මයට අනුව සැකසී ඇති මෙම ප්‍රශ්නය සඳහා ඉදිරිපත් කොට ඇති මඟ පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලසේ.

**2.** පහත දැක්වෙන (i), (ii), (iii) හා (iv) යන විස්තර අතුරින් එකක් තෝරා ගෙන වචන **250** කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අංකය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. *(ලකුණු 25 යි)*

(i) කොවිඩ් 19 වසංගතය ලොව පුරා ව්‍යාප්ත ව අති බිහිසුණු අන්දමින් මිනිස් ජීවිත බිලි ගනිමින් පවතී. සංවර්ධන කටයුතු අඩාළ වී දිනෙන් දින පිරිහෙන ආර්ථික තත්ත්වයක් සැම රටවල ම දක්නට ලැබේ. ජන ජීවිතය හා සම්බන්ධ සැම අංශයක් ම අක්‍රිය තත්ත්වයට පත් ව ඇත. මිනිසාගේ ම අදූරදර්ශී ක්‍රියාවලට ස්වභාවධර්මය විසින් දෙන ලද දඬුවමක් වශයෙන් ද ඇතැම්හු මෙය දකිති.

(ii) මිනිසාගේ ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා ආගම ඉවහල් වේ. එහෙත් ඒ සඳහා ඒ ඒ ආගම් මගින් ඉදිරිපත් කෙරෙන දර්ශනය වෙත නොව බාහිර පුද සිරිත් කෙරෙහි යොමුවීම, ආගමික දර්ශනය විකෘත කොට අන්තවාදී අදහස් ඇරීම ආදිය නිසා ද ආගමකින් අපේක්ෂිත සාරධර්ම පිරි සමාජයක් බිහිවෙතැයි සිතීම අසීරු ය.

(iii) ආහාර, ඖෂධ, පිරිසිදු වාතය හා සෙවණ ලබා දෙමින් පස හා ජලය සුරකිමින් ලාභාපේක්ෂාවෙන් තොර ව පරාර්ථය උදෙසා ම කැප වූ තුරුලිය වෙත කෘතවේදීත්වය දක්වනු වෙනුවට මිනිසා ආත්මලාභය උදෙසා ම වන සංහාරයේ යෙදී සිටියි. මිනිසාට එහි දුර්විපාක විඳීමට සිදුවන කාලය වැඩි ඈතක නො වේ. උපතේ සිට මරණය තෙක් ජීවිතය සමග බැඳී සිටින වන සම්පත සුරැකීම අනාගත පරපුරේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීමකි.

(iv) කලාවෙන් සිදු විය යුත්තේ ආනන්දයෙන් ප්‍රඥාවට මග සැලසීම යයි පැවසේ. මෙහිලා සාහිත්‍ය කලාවෙන් සිදුවන මෙහෙය අසීමිත ය. මනා ජීවිත අවබෝධයක් ලැබීමටත් පුද්ගලයා තුළ යහපත් ආකල්ප වගා කර ගැනීමටත් සාහිත්‍යයෙන් ලැබෙන පිටිවහල මෙතෙකැයි කිව හැකි නොවේ. සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය කෙරෙහි රූපවාහිනිය හා පරිගණකය ආදී මෙවලම්වලින් අභියෝග එල්ල වුව ද සාරධර්ම පිරි යහපත් සමාජයක් බිහි කිරීමෙහි ලා සෙසු සැම කලා මාධ්‍යයකට ම වඩා සාහිත්‍ය කලාව ඉදිරියෙන් සිටී.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

සංස්ලේෂණ හැකියාව එනම් කිසියම් සමස්තයක් ගොඩනැගීමේ හැකියාව හා ඡේදයක විවිධ කොටස් හඳුනා ගෙන ඒ අනුකොටස් අතර නිවැරදි සම්බන්ධතාව පවත්වා ගනිමින් අලුත් යමක් නිර්මාණය කිරීමේ හැකියාව මැන බැලීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිතයි.

රචනා සඳහා ප්‍රධාන මඟපෙන්වීම් හතරක් පහත සඳහන් තේමා යටතේ ඉදිරිපත් කොට ඇත.

1. කොරෝනා හෙවත් කොවිඩ් 19 වංගතය හමුවේ ලෝකය
2. ආගමික ශාස්තෘවරුන් අපේක්ෂා කළ අරමුණු වර්තමාන අනුගාමිකයන් කෙරෙන් ඉටුවේ ද?
3. අනාගත පරපුර උදෙසා වන සම්පත සුරකිමු
4. යහපත් සමාජයක් උදෙසා සාහිත්‍ය කලාවේ දායකත්වය

**<u>ලකුණු ප්‍රදානය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු</u>**

ලකුණු ප්‍රදානය තේමා තුනක් යටතේ සිදු විය යුතු ය.

| | | |
|---|---|---|
| 1. | සාරවත්භාවය (මාතෘකාව ද ඇතුළුව) | **(ලකුණු 12යි.)** |
| 2. | රචනා ශෛලිය හා භාෂා විලාසය | **(ලකුණු 08යි.)** |
| 3. | ශිල්පීය දක්ෂතා | **(ලකුණු 05යි.)** |

| | |
|---|---|
| **1. විස්තරයට අදාළ මාතෘකාව සඳහා** | **(ලකුණු 01යි.)** |
| **සාරවත් භාවය සඳහා** | **(ලකුණු 11යි.)** |

**සාරවත් භාවය යටතේ,**

- තේමාවට අදාළ බව
- ඉදිරිපත් කර ඇති ව්‍යුහයට සමීප බව
- සාරවත් බව
- වචන ගණන 250ට සමීප ව තිබීම ආදිය සැලකිල්ලට ගත ගන්නා ලදි. 350 වැඩි නම් ලකුණු 01ක් ද, 200ට අඩුනම් ලකුණු 01ක් ද, අඩු කරන ලදි.

**2. රචනා ශෛලිය හා භාෂා විලාසය** **(ලකුණු 08යි.)**

- උසස් ප්‍රකාශන ශක්තිය
- නිර්මාණාත්මක අදහස්
- ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදිය පිළිබඳ මේ යටතේ සැලකිලිමත් විය යුතු ය.


**3. ශිල්පීය දක්ෂතා** **(ලකුණු 05යි.)**

- වියරණ
- අත් අකුරු
- විරාම ලක්ෂණ
- පද බෙදා ලිවීම
- සුදුසු පරිදි ඡේද වෙන්කර ලිවීම

**(ලකුණු 25යි.)**

ආදිය මේ යටතේ අවධානයට ලක් විය යුතු ය.

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**





මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 96%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ඉන් | 0 - 6 | ප්‍රාන්තරයේ | 3% ක් ද, |
| | 7 - 12 | ප්‍රාන්තරයේ | 18% ක් ද, |
| | 13 – 18 | ප්‍රාන්තරයේ | 56% ක් ද, |
| | 19 - 25 | ප්‍රාන්තරයේ | 23% ක් ද |

ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රමාණය 21%කි. 19 - 25 අතර ලකුණු ලබා ගත් ප්‍රමාණය 23%කි. සමස්තයක් වශයෙන් ගත් කළ රචනා ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම සාධනීය මට්ටමක පවතී.




මෙම ප්‍රශ්නයෙහි (i), (ii), (iii), (iv) පිළිවෙළින්, කොවිඩ් 19 වසංගතය නිසා ලොව පුරා රටවල් මුහුණ පෑ ආර්ථික අභේනිය, ආගම්වලින් අපේක්ෂිත සාරධර්මවලින් පිරි සමාජයක් බිහි නොවීමට බල පෑ වැරදි ඇදහීම් ක්‍රම, වන සම්පත සුරැකීමේ වැදගත්කම, යහපත් සමාජයක් උදෙසා සාහිත්‍ය කලාවේ වැදගත්කම යන මාතෘකා තේමා කර ගනිමින් මාර්ගෝපදේශ රචනා සඳහා විස්තරාත්මක ව්‍යූහගත ඡේද හතරක් ඉදිරිපත් කොට තිබුණි. ඒවායින් වැඩි ම පහසුතාව පෙන්නුම් කර ඇත්තේ වන සම්පත සුරැකීමේ වැදගත්කම යන මාතෘකාවටයි. එහි සාරවත්භාවය, රචනා ශෛලිය හා භාෂා විලාසය, ශිල්පීය දක්ෂතා සඳහා පහසුතා පිළිවෙළින් 63%,59% හා 53% වශයෙන් වන අතර අඩු ම පහසුතාවක් පෙන්වා ඇති යහපත් සමාජයක් උදෙසා සාහිත්‍ය කලාවේ වැදගත්කම යන මාතෘකාව යටතේ පහසුතා පිළිවෙළින් 31%, 28% හා 30% වශයෙන් වෙයි.

(i) සහ (ii) සඳහා සමස්ත පහසුතාව 50%ක් හෝ ඊට වැඩි අතර සමස්තයක් වශයෙන් අපේක්ෂකයන්ගේ අදහස් නිර්මාණාත්මක ව සංවිධානාත්මක ව හා නිරවුල් ව ව්‍යාකරණානුකූල ව ඉදිරිපත් කිරීමට තව දුරටත් යොමු කිරීම සුදුසු ය.

මාර්ගෝපදේශයේ කරුණු ඉදිරිපත් කර ඇති රටාව සැලකිල්ලට ගැනීමෙන් මාතෘකාව හඳුනා ගැනීමටත් රචනා සැකිල්ලක් යටතේ කරුණු සංවිධානය කර ගැනීමටත් අපේක්ෂකයන්ට අවස්ථාව සැලසේ. වචන සංඛ්‍යාව 250කට නොඅඩු යන සීමාව නිසා රචනාව වචන 250 - 300 අතර පවත්වා ගැනීමට අවකාශ සැලසේ.

අතිරේක පොතපත කියවීම, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යය පරිශීලනය, විශේෂයෙන් අන්තර්ජාලය ඇසුරෙන් නව ලෝකය පිළිබඳ දැනුම පුළුල් කර ගැනීම සාර්ථක රචනා කුසලතාවක් නිර්මාණය කර ගැනීමට මහඟු අත්වැලක් කර ගත හැකි ය.

දී ඇති රචනා ව්‍යූහ අතුරෙන් අපේක්ෂකයන්ට මඟ පෙන්වීමක් වශයෙන් (iii) මාතෘකාව යටතේ රචනා ආදර්ශයක් මෙහි දක්වා ඇත.

**ආදර්ශ රචනය**

**වන සම්පත සුරකිමු**

ආහාර, ඖෂධ, පිරිසිදු වාතය වැනි මිනිසාට ජීවත් වීමට අත්‍යවශ්‍ය දේ සපයා දෙමින් පස හා ජල සම්පත සුරකිමින් තමා විනාශ කිරීමට පැමිණෙන මිනිසාට පවා සෙවණ සලසමින් අවම වශයෙන් සිය පැවැත්ම සඳහා ජලය බිඳකුදු නොඉල්වා පරාර්ථය සඳහා ම කැප වූ ගස් වැල් සිය ආත්ම ලාභය උදෙසා විනාශ කිරීමට පෙලඹීමෙන් ම මිනිසාගේ අකෘතඥභාවය පිළිඹිඹු කරයි.

ස්වභාව ධර්මය ජය ගැනීම සංවර්ධනය යැයි සිතන මිනිසා වන සම්පත විනාශ කරමින් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරමින් පරිසර සංරක්ෂණය කෙරෙහි කිසිඳු අවධානයක් යොමු නොකර අදූරදර්ශී ලෙස ක්‍රියා කිරීමේ අනිටු විපාක වර්තමානයේ විද්‍යමාන වෙමින් පවතී. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම, පරිසර දූෂණය, ජල සම්පත විනාශ වීම, පාංශු ඛාදනය නිසා අස්වැන්න අඩු වීම ආදි බොහෝ ගැටලුවලට මිනිසාට වර්තමානයේ මුහුණ දීමට සිදුව තිබේ. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා ධ්‍රැව ප්‍රදේශවල අයිස් දිය වීමෙන් සාගර ජල මට්ටම ඉහළ යාම සමුද්‍ර ඛාදනය වැඩි වීමට හා කුඩා දූපත් ජලයෙන් යට වී යාමට හේතු වී තිබේ.

වන වැස්ම ඉවත් වීමෙන් පාංශු ඛාදනය උග්‍ර වීම නිසා අසාරවත් පසට රසායනික පොහොර යෙදීමෙන් චක්‍රීය ලෙස පස තවදුරටත් විනාශ වී යයි. භූගත ජල මට්ටම පහළ යාම නිසා උග්‍ර පානීය ජල හිඟයකට ද මිනිසාට මුහුණ දීමට සිදුව තිබේ. පරිසර සමතුලිතතාව ආරක්ෂා කරන වන වැස්ම ඉවත් වීම නිසා වායු දූෂණය මිනිසා මුහුණ පාන තවත් ගැටලුවකි.

මෙසේ වන සම්පත විනාශ කිරීම නිසා අනේකවිධ දේශගුණික හා පාරිසරික ප්‍රශ්නවලට මුහුණ පා සිටින මිනිසා මින් ඉදිරියට හෝ පරිසරය කෙරෙහි අවධානය යොමු නොකර ක්‍රියා කළහොත් අනාගත පරපුර සඳහා සුරක්ෂිත පරිසරයක් දායාද කිරීමට හැකි නොවේ.

තොටිල්ලේ සිට මරණ මංචකය දක්වා මිනිසාට පිහිට වන තුරුලතා සංරක්ෂණය කෙරෙහි නිසි අවධානය යොමු නොකරන්නේ නම් මානව පරපුරේ පමණක් නොව සමස්ත ජීවගෝලයේ ම අවසානය සනිටුහන් වන දවස වැඩි ඈතක නොවනු ඇත.

3 ප්‍රශ්නය

අපේක්ෂණය : **කිසියම් කොටසක් කියවා එහි සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මැනීම**

ව්‍යුහය : **දී ඇති පාඨය තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලිවීම.**

**3.** පහත දැක්වෙන පාඨය වචන **50 - 60** අතර වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න. *(ලකුණු 10 යි)*

දේශප්‍රේමය, දේශානුරාගය නැතහොත් දේශාභිමානය යනුවෙන් අදහස් කෙරෙනුයේ පුරවැසියෙකුට සිය මවුබිම, ජන්මභූමිය කෙරෙහි ඇතිවන කැපවීම හා ගෞරවාන්විත හැඟීම යි. මෙය සංස්කෘතික බැඳීමක් සේ සැලකෙයි. ඇතැම් විටෙක මේ සංස්කෘතික බැඳීම කෙරෙහි ඔවුන්ගේ ආගමික විශ්වාසයන්හි සමානත්වය ද බලපාන අවස්ථා හමුවෙයි.

එක් ස්වාධීන ජාතියක් යුද්ධ, ආක්‍රමණ, දේශපාලන ගිවිසුම් හෝ කුමන්ත්‍රණ ආදිය මගින් තවත් ජාතියක් විසින් යටත් කර ගත් කල්හි යටත් කර ගනු ලැබුණු ජාතියෙහි සාමාජිකයන් අතර දේශානුරාගී, දේශාභිමානී හැඟීම් ඇතිවීම නිරීක්ෂණය කළ හැකි ය. යටත් විජිතභාවයෙන් නිදහස ලැබීමෙන් අනතුරුව ද දේශපාලන හා ආර්ථික නිදහස අරමුණු කොටගත් ගමනේ දී ජාතියකට දේශානුරාගී, දේශාභිමානී හැඟීම් පුබුදුවාලීම අත්‍යවශ්‍ය වෙයි. මේ හැඟීම් ප්‍රකාශයට පත් කෙරෙන ප්‍රධාන මාර්ගයක් වනුයේ සාහිත්‍ය නිර්මාණ යි. ඒ අතරිනුදු විවිධ පද්‍ය කාව්‍ය ප්‍රභේද දේශාභිමානී හැඟීම් පුබුදුවාලීමට හා ප්‍රකට කිරීමට ඉවහල් කොට ගැනේ.

විසිවන සියවසේ මුල් භාගයේ යටත් විජිත විරෝධී හැඟීම් ඉස්මතු කෙරෙමින් නිර්මාණකරණයෙහි නිරත වූ ලේඛකයන් අතුරින් ඇස්. මහින්ද හිමි, ආනන්ද රාජකරුණා හා කුමාරතුංග මුනිදාස ප්‍රමුඛස්ථානය හිමි කර ගනිති. දිවයින බ්‍රිතාන්‍ය යටත් විජිත තත්ත්වයෙන් නිදහස් වූ පසුව ද දේශාභිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ප්‍රචලිත විය. අරිසෙන් අහුබුදු, මහගම සේකර ආදී රචකයන්ගේ දේශාභිමානී සාහිත්‍ය ප්‍රබන්ධ මේ යුගයෙහි බිහි වූ නිර්මාණ අතුරින් විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ ඒවා සාහිත්‍යමය ගුණයෙන් ද සුපෝෂිත වීම හේතුවෙනි.

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**සාරාංශය සඳහා අන්තර්ගත විය යුතු කරුණු**

- දේශානුරාගය පුරවැසියකු සතු සංස්කෘතික බැඳීමක් බව
- පරාධීන ජාතියක් ස්වාධීනත්වය දිනා ගැනීමට ද ස්වාධීන වූ කළ දේශපාලනය හා ආර්ථික නිදහස දිනා ගැනීමට ද දේශානුරාගී හැඟීම් පුබුදුවාලිය යුතු බව
- ඒ අවශ්‍යතාව සපුරාලන සාහිත්‍ය නිර්මාණ අතර පද්‍ය කාව්‍ය ප්‍රමුඛ වන බව
- මෙහි පූර්ව ස්වාධීන සමය එස් මහින්ද හිමි, ආනන්ද රාජකරුණා හා කුමාරතුංග මුනිදාස ද අපර සමය අරිසෙන් අහුබුදු, මහගමසේකර ආදි කවීහු ද ගුණාත්මක කවියෙන් සපුරා ලූ බව

**ලකුණු ප්‍රදානය කිරීමේ දී සැලකිල්ලට ගත් කරුණු**


**ලකුණු ප්‍රදානය තේමා තුනක් යටතේ සිදු විය**

| | |
|---|---|
| අන්තර්ගතය | ලකුණු 06යි |
| භාෂා භාවිතය | ලකුණු 02යි |
| ශෛලිය | ලකුණු 02යි |

තනි ඡේදයක් ලෙස ලියා නැත්නම් ශෛලියට ඇතුළත් ලකුණු දෙකන් 01ක් අඩු කරන ලදි.

**(ලකුණු 10යි.)**


3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 92%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන් 0 - 2 ප්‍රාන්තරයේ 1%ක් ද,
3 - 5 ප්‍රාන්තරයේ 28%ක් ද,
6 – 7 ප්‍රාන්තරයේ 49%ක් ද,
8 - 10 ප්‍රාන්තරයේ 22%ක් ද
ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු 10 න් හරි අඩකට වැඩියෙන් එනම් ලකුණු 6ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හිමි කර ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 71%කි. ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 29%ක් පමණි




අනිවාර්ය ප්‍රශ්නයක් වූ සාරාංශකරණය සඳහා පිළිතුරු සැපයූ අපේක්ෂක සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතින අතර ඔවුන්ගෙන් 71%ක බහුතරයක් ප්‍රදානය කෙරෙන ලකුණුවලින් අඩකට වැඩියෙන් ලබා ගැනීමට සමත් වී ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු හිමි වූයේ

- අන්තර්ගතය
- භාෂා භාවිතය
- ශෛලිය යන කරුණු තුනට ය.

මෙම ප්‍රශ්නයේ අන්තර්ගතයේ පහසුතාව 59%ක් ද භාෂා භාවිතයේ පහසුතාව 62%ක් ද භාෂා ශෛලියේ පහසුතාව 53%ක් ද වශයෙන් වේ. සමස්තයක් වශයෙන් ගත් කළ සාරාංශකරණය සඳහා පහසුතාව 58%ක් වේ.
අපේක්ෂකයන්ට සාරාංශකරණය පිළිබඳ මනා පුහුණුවක් තිබිය යුතු ය. ඒ සඳහා නිරන්තර අභ්‍යාසවල යෙදීම අනිවාර්ය වේ. අපේක්ෂිත සාරාංශකරණය සඳහා ආදර්ශයක් පහත දැක්වේ.

**ආදර්ශ සාරාංශය**

දේශානුරාගය පුරවැසියකු සතු සංස්කෘතික බැඳීමකි. ජාතියක් පරාධීන වූ කල ස්වාධීනත්වය උදෙසා ද ස්වාධීන වූ කළ දේශපාලන හා ආර්ථික නිදහස උදෙසා ද දේශානුරාගය පුබුදුවාලීම අවශ්‍ය ය. ඒ අවශ්‍යතාව සපුරාලන සාහිත්‍ය නිර්මාණ අතර පද්‍ය කාව්‍ය ප්‍රමුඛ වේ. මෙහි පූර්ව ස්වාධීන සමය එස්. මහින්ද හිමි, ආනන්ද රාජකරුණා හා කුමාරතුංග මුණිදාස ද අපර සමය අරිසෙන් අහුබුදු, මහගමසේකර ආදි කවීහු ද ගුණාත්මක කවියෙන් සපුරාලූහ.

(වචන 60යි)

4 ප්‍රශ්නය

අපේක්ෂණය : ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීම

ව්‍යූහය : විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විතය.

**4. පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.** *(ලකුණු 10 යි)*

මිනිසා විසින් සොයා ගන්නා ලද හා නිර්මාණය කරන ලද සියල්ල අතුරින් භාෂාව මුල් තැන ගනී. අප චින්තනයේ යෙදෙන්නේ ද චින්තනයෙන් මතු කර ගන්නා අදහස් හා හැඟීම් ප්‍රකාශ කරන්නේ ද ප්‍රධාන කොට ම භාෂාව ඇසුරිනි. ඒ අදහස් පරම්පරාවකින් පරම්පරාවක් කරා ගලා එන්නේ ද බහුල වශයෙන් භාෂා මාධ්‍යයෙනි. ඒ අනුව ද භාෂාව සංස්කෘතියේ ප්‍රවාහකය වේ.

මනුෂ්‍ය ජීවිතයෙහි මේ සා උසස් තැනක් ගන්නා භාෂාව සියලු විෂය අධ්‍යයනයෙහි මාධ්‍යය බව වෙසෙසින් නොකිව මනා ය. තව ද පැවසිය යුතු කරුණෙකි. භාෂාව ද විෂය ගණයට වැටේ. ඒ නිසා අප භාෂාවෙන් ඉගෙන ගන්නා සේ ම භාෂාව ද උගත යුතු ය.

උගත යුත්තක් වශයෙන් භාෂාවෙහි ද අන්තර්ගතයක් ඇති බවත් වහරෙහි සදොස්-නිදොස්, උචිත-අනුචිත, උසස්-පහත් ස්වරූප පවතින බවත් පිළිගත මනා ය. ඒ අතුරින් නිදොස් වූත්, උචිත වූත්, උසස් වූත් ලක්ෂණ සිය වහරෙහි යොදන්නෝ තමනට ඇවැසි නිරවුල් වූත්, රසවත් වූත්, බලවත් වූත් භාෂා රීතියක් නිෂ්පාදනය කර ගනිති.

(i) ලේඛකයා මෙහි දක්වන පරිදි භාෂාව ඇසුරින් කරන කාර්යය තුනක් දක්වන්න.

(ii) භාෂාව විෂයයක් වන්නේ ඇයි?

(iii) මෙහි දැක්වෙන පරිදි වහරෙහි පවත්නා ස්වරූප තුන මොනවා ද?

(iv) නිරවුල් වූත්, රසවත් වූත්, බලවත් වූත් භාෂා රීතියක් නිෂ්පාදනය කර ගැනීමට අවශ්‍ය කවුරුන්ට ද?

(v) 'ප්‍රවාහකය' යන්න වෙනත් වචනවලින් පැහැදිලි කරන්න.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

1) චින්තනයේ යෙදීම, අදහස් හා හැඟීම් ප්‍රකාශනය, පරම්පරාවෙන් පරම්පරාවට අදහස් ගෙන යාම, අධ්‍යයන මාධ්‍යය ලෙස යොදා ගැනීම

2) භාෂාව උගත යුත්තක් නිසා ය.

3) සදොස් නිදොස් ස්වරූපය
උචිත අනුචිත ස්වරූපය
උසස් පහත් ස්වරූපය


4) නිදොස් වූ ද උචිත වූ ද උසස් වූ ද ලක්ෂණ සිය වහරෙහි යොදන්නවුන්ට ය.

5) ගෙන යන හෝ ප්‍රවාහනය කරන උපකරණය/ මෙවලම හෝ වාහකය

**(ලකුණු 10යි.)**

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**


4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 92%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන් 0 - 2 ප්‍රාන්තරයේ 24% ක් ද,
3 - 5 ප්‍රාන්තරයේ 48% ක් ද,
6 – 7 ප්‍රාන්තරයේ 18% ක් ද,
8 - 10 ප්‍රාන්තරයේ 10% ක් ද
ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත් පිරිස 28%ක් වන අතර 72%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5 හෝ ඊට අඩු ප්‍රමාණයකි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 5 අතුරෙන් පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක වී ඇත්තේ (iii) කොටස සඳහා ය. එහි පහසුතාව 72%කි. (i), (ii), (iv), (v) කොටස්වල පහසුතාව පිළිවෙළින් 60%, 18%,23%,16%ක් වශයෙනි. (I) කොටසේ පහසුතාව උසස් මට්ටමක පවතින අතර (ii),(iv) හා (v) කොටස්වල පහසුතාව ඉතා අඩු මට්ටමකි. ඉදිරිපත් කර ඇති ඡේදය අවබෝධයෙන් යුතුව කියවා අසා ඇති ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයා ගැනීමට අපේක්ෂකයන් සමත් විය යුතු නමුත් බහුතර පිරිසක් තුළ එම කුසලතාව වර්ධනය වී නොමැති බව (ii), (iv), (v) අනුකොටස්වල පහසුතාව මගින් පිළිබිඹු වේ.

දෙන ලද ඡේදය ඇසුරෙන් අපේක්ෂකයන්ගේ අවබෝධය මැනීම තවදුරටත් සංවර්ධනය කර ගැනීම සඳහා බාහිර පොතපත, මුද්‍රිත සඟරා ආදිය පරිශීලනය සඳහා ඔවුන් යොමුකරලීම මෙන් ම පන්ති කාමරය තුළ දී අර්ථාවබෝධය පිළිබඳ අභ්‍යාසවලට හුරු කිරීම ද කළ යුතු ය.
දෙන ලද ඡේදය කියවා අසන ලද ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු ඍජුව තෝරා ගෙන ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන් යොමු කළ යුතුව ඇත.

අවබෝධය පිළිබඳ විමසා තිබූ 4 ප්‍රශ්නයෙහි කොටස් 5හි පහසුතාව 16% - 72% අතර තිබිණි. ඒ අනුව මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 38%කි. මෙම තත්ත්වය සංවර්ධනය කිරීම සඳහා බාහිර පොත්පත් පරිශීලනය කිරීමට ශිෂ්‍යයන් උනන්දු කරවීම ගුරුභවතුන්ගේ කාර්යයකි. එහිලා දුරවබෝධ වචනවල අර්ථාවබෝධයට ද ශිෂ්‍යයන් යොමු කළ යුතු ය.

5 ප්‍රශ්නය

අපේක්ෂණය : ප්‍රායෝගික ලේඛන පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම.

ව්‍යුහය : නිර්දිෂ්ට ප්‍රායෝගික ලේඛන දෙකක් ඇසුරෙන් ප්‍රශ්නය සැකසී ඇත.

**5.** ඔබ ඉසුරුගම සමූහ වාර්තාකරු ලෙස සලකා පහත සඳහන් තොරතුරු පදනම් කර ගෙන පුවත්පත් වාර්තාවක් පිළියෙල කරන්න.

| | | |
|---|---|---|
| සංවිධානය | : | ඉසුරුගම මිණිමුතු සමාජය |
| දිනය | : | 2020.01.30 |
| සිදුවීම | : | ආදර්ශවත් සිසුවකුට උපහාර දැක්වීමේ උත්සවයක් |
| හේතුව | : | ඉසුරුගම මහා විද්‍යාලයේ 12 වන වසරේ ඉගෙනුම ලබන ප්‍රදීප් ධනංජය සිසුවා ඉසුරුගම බස් නැවතුම්පොළේ වැටී තිබුණු ස්විට්සර්ලන්ත ජාතික සංචාරකයකුට අයත් මුදල් පසුම්බියක් අහුලා ගෙන ඉසුරුගම පොලිස් ස්ථානාධිපතිවරයාට බාර දීම |
| ස්ථානය | : | ඉසුරුගම මහා විද්‍යාලයීය සම්මන්ත්‍රණ ශාලාව |
| මුලසුන | : | ඉසුරුගම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කපිල සමරසිංහ මහතා |
| ආරාධිතයන් | : | ඉසුරුගම මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා |
| | | ඉසුරුගම පොලිස් ස්ථානාධිපතිතුමා |
| | | ඉසුරුගම මිණිමුතු සමාජයේ සභාපතිතුමා |

මිණිමුතු සමාජය මගින් පාසල් සිසුවාට රු. 10 000/- ක චෙක්පතක් පරිත්‍යාග කිරීම ද මෙහි දී සිදු විය.

(වචන 100 ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.)

*(ලකුණු 15 යි)*

නැතහොත්

මංගලගම විද්‍යාවංස පිරිවෙනේ පුරා අවුරුදු 35ක් ගුරුවරයකු වශයෙන් සේවය කොට විශ්‍රාම ලබන සුනිල් ප්‍රේමතිලක මහතාට උපහාර දැක්වීමේ උත්සවයක් 2021 මාර්තු මස 29 වෙනි දින ප.ව. 2.00 ට තත් පිරිවෙන් ශාලාවේ දී සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) රාජකීය පණ්ඩිත පූජ්‍ය පලන්නොරුවේ අස්සජි නා හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත් වේ. එම උත්සව සංවිධාන කමිටුවේ ලේකම් ඔබ යැයි සිතා එම අවස්ථාවට සහභාගි වන ලෙස ආරාධනා කරමින් ශිෂ්‍ය හිමිවරුන්ගේ භාරකාර හිමිවරුන් වෙත යැවීම සඳහා ලිපියක් සකස් කරන්න.
(වචන 100 ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.)

*(ලකුණු 15 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**වාර්තාව**

- ආකෘතිය - (ලකුණු 04යි.)
  - මාතෘකාව **(ලකුණු 01යි)**
  - වාර්තාකරුගේ නම **(ලකුණු 01යි)**
  - සංක්ෂිප්තභාවය **(ලකුණු 02යි)**

- අන්තර්ගතය - (ලකුණු 08යි.)
  - අදාළ සිදුවීම **(ලකුණු 01යි)**
  - සංවිධානය **(ලකුණු 01යි)**
  - දිනය **(ලකුණු 01යි)**
  - ස්ථානය **(ලකුණු 01යි)**
  - හේතුව **(ලකුණු 02යි)**
  - මුලසුන හා සහභාගිත්වය **(ලකුණු 02යි)**

■ ශිල්පීය දක්ෂතා - (ලකුණු 03යි.)

- අක්ෂර වින්‍යාසය හා අත් අකුරු **(ලකුණු 01යි)**
- උක්තාඛ්‍යාත පද සම්බන්ධය **(ලකුණු 01යි)**
- පදබෙදා ලිවීම හා විරාම ලක්ෂණ **(ලකුණු 01යි)**

නැතහොත්

**ලිපිය**

■ ආකෘතිය - (ලකුණු 04යි.)

- යවන්නාගේ ලිපිනය හා දිනය **(ලකුණු 01යි)**
- ආමන්ත්‍රණය **(ලකුණු 01යි)**
- මාතෘකාව **(ලකුණු 01යි)**
- අවසානය ලේකම්ගේ අත්සන, තනතුර, නම **(ලකුණු 01යි)**

■ අන්තර්ගතය - (ලකුණු 08යි.)


- උපහාර උත්සවය හා ඊට හේතුව **(ලකුණු 02යි)**
- ස්ථානය **(ලකුණු 02යි)**
- දිනය හා වේලාව **(ලකුණු 02යි)**
- ආරාධනය **(ලකුණු 02යි)**

■ ශිල්පීය දක්ෂතා - (ලකුණු 03යි.)

- අක්ෂර වින්‍යාසය හා අත් අකුරු **(ලකුණු 01යි)**
- උක්තාඛ්‍යාත පද සම්බන්ධය **(ලකුණු 01යි)**
- පද බෙදා ලිවීම හා විරාම ලක්ෂණ **(ලකුණු 01යි)**

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**

**5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය**





මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 83%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් 0 - 3 ප්‍රාන්තරයේ 4%ක් ද,
4 - 7 ප්‍රාන්තරයේ 9%ක් ද,
8 – 11 ප්‍රාන්තරයේ 67%ක් ද,
12 - 15 ප්‍රාන්තරයේ 20%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්නයකි. දී ඇති ප්‍රශ්න දෙක අතුරෙන් එක් ප්‍රශ්නයක් තෝරා ගෙන පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ට අවස්ථාව ලබා දී ඇත.





5 වන ප්‍රශ්නයේ වෛකල්පික ප්‍රශ්න දෙක සඳහා සමස්ත පහසුතාව පිළිවෙළින් 51%ක් හා 57%කි. ඒ අනුව පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතී. ප්‍රායෝගික ලේඛන යටතේ පළමු ප්‍රශ්නය වන පුවත්පත් වාර්තාවේ ආකෘතියට ලකුණු 4ක් ද අන්තර්ගතයට ලකුණු 8ක් ද ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 3ක් ද වෙන් කර ඇත. විකල්ප ප්‍රශ්නය වන රාජකාරි ලිපියේ ආකෘතියට ලකුණු 4ක් ද අන්තර්ගතයට ලකුණු 8ක් ද ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 3ක් ද වෙන් කර ඇත.

මෙම ප්‍රශ්නයේ පළමු ප්‍රශ්නය වන එනම් පුවත්පත් වාර්තාවේ දී ආකෘතිය, අන්තර්ගතය, ශිල්පීය දක්ෂතා යන කරුණු සඳහා ලකුණු ලබා ගැනීමේ දී යම් දුර්වලතාවක් පෙන්නුම් කරන අතර රාජකාරි ලිපියේ ආකෘතිය, අන්තර්ගතය, ශිල්පීය දක්ෂතා යන කරුණු සඳහා ලකුණු ලබා ගැනීමේ දී මධ්‍යස්ථ මට්ටමක් පෙන්නුම් කරයි.

මෙහි දී අන්තර්ගතයට අයත් ප්‍රධාන කරුණු හඳුනා ගැනීමට අපේක්ෂකයන් හුරු කළ යුතු ය. එසේ වූ විට අන්තර්ගතයට වෙන් කර ඇති මුළු ලකුණු අපේක්ෂකයන්ට හිමි කර ගැනීමට පහසු වේ. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම සතුටුදායක ය. නියමිත ප්‍රායෝගික ලේඛන ආකෘතියට අනුව ලිවීම හුරු කළ යුතු ය. මෙබඳු ප්‍රශ්නවල සාධන මට්ටම ඉහළ නංවා ගැනීම සඳහා විවිධ ප්‍රායෝගික ලේඛනවලට අදාළ ආකෘති පිළිබඳ ව අපේක්ෂකයන් දැනුවත් කොට සුදුසු අභ්‍යාසවල යෙදවීම යෝග්‍ය වේ.

## 2.8.3 I ප්‍රශ්න පත්‍රයේ II කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 8 (RD/16/4/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

I ප්‍රශ්න පත්‍රයේ II කොටසෙහි ප්‍රශ්න පහට ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. අපේක්ෂකයන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ පළමුවන ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 100%කි. අඩු ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ 5 ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 83%කි. එසේ වුව ද අඩු ම පහසුතාව පෙන්වා ඇත්තේ වැඩි ම ප්‍රතිශතයක් පිළිතුරු සැපයූ පළමුවන ප්‍රශ්නයට ය. එහි පහසුතාව 28%කි. අඩු ම ප්‍රතිශතයක් ප්‍රතිචාර දැක්වූ 5වන ප්‍රශ්නයේ පහසුතාව 54%කි.

පළමුවන ප්‍රශ්නය සරල ව්‍යාකරණමය හා භාෂාත්මක රීතිවලින් සමන්විත වන අතර ඊට ලකුණු 20ක් හිමි වේ. එහෙත් වියරණ විධි හා භාෂා පිළිබඳ ව අපේක්ෂකයන් සතු දැනුම හා අවබෝධය අවම වීම ලකුණු අඩු වීමට හේතු ලෙස දැක්විය හැකි ය.

අපේක්ෂකයන් සතු සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැනීම අරමුණු කරගත් දෙවන ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි අතර 96%ක් පිළිතුරු සැපයූ එහි පහසුතාව 49%ක මධ්‍යස්ථ මට්ටමක පවතී.

එමෙන්ම සාරාංශකරණය පිළිබඳ ව අපේක්ෂකයන් සතු සාධන මට්ටම මැනීම තුන්වන ප්‍රශ්නයේ අරමුණ වන අතර ඊට හිමි ලකුණු ප්‍රමාණය 10කි. 92%ක් ප්‍රතිචාර දැක්වූ එම ප්‍රශ්නයේ පහසුතාව 58%කි. ප්‍රශ්න 5න් වැඩි ම පහසුතාව ප්‍රදර්ශනය කළ ප්‍රශ්නය මෙයයි.

92% ප්‍රතිචාර දක්වා තිබූ 4වන ප්‍රශ්නයෙහි පහසුතාව 38%ක් තරම් අඩු අගයකි. ගද්‍ය ඡේදයක් ඇසුරෙන් සකස් කෙරෙන ප්‍රශ්න මගින් අපේක්ෂකයන්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කිරීම 4වන ප්‍රශ්නයේ අරමුණයි. බාහිර පොතපත පරිශීලනයේ අඩුකම භාෂා කුසලතාවේ අඩුකම මෙම ප්‍රශ්නයට අඩු සාධන මට්ටමක් පිළිබිඹු වීමට හේතු ලෙස පෙනේ.

ප්‍රායෝගික ලේඛන සැකසීමේ දී අපේක්ෂකයන් සතු කුසලතාව මැනීම පස්වන ප්‍රශ්නයේ අරමුණයි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු ප්‍රමාණය 15කි. 83%ක් ප්‍රතිචාර දක්වා තිබූ මෙම ප්‍රශ්නයේ පහසුතාව 54%කි.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3.0 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 3. 1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

II පත්‍රය - **කාලය : පැය 02 යි.**

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **හතකින්** සමන්විත ය.

**1, 2, 3, 4** ප්‍රශ්න අනිවාර්ය වේ. **5, 6, 7** ප්‍රශ්නවලින් **එකක්** තෝරා ගත යුතු ය.


| | | |
|---|---|---|
| 1 ප්‍රශ්නය | : | කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත ය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි. |
| 2 ප්‍රශ්නය | : | නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරා ගත් ගද්‍ය/පද්‍ය කොටස් ඇසුරෙන් මේ ප්‍රශ්නය සකස් කෙරෙන අතර අනුකොටස් දෙකකින් යුත් කොටස් 5කින් සමන්විත වේ. එක් අනුකොටසකට ලකුණු 02 බැගින් ලකුණු 20කි. |
| 3 ප්‍රශ්නය | : | වෛකල්පික ප්‍රශ්න දෙකකින් එකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. ලකුණු 15කි. |
| 4 ප්‍රශ්නය | : | වෛකල්පික ප්‍රශ්න දෙකකින් එකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. ලකුණු 15කි. |
| 5, 6, 7 ප්‍රශ්න | : | වෛකල්පික ප්‍රශ්න තුනකින් ප්‍රශ්න එකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. ලකුණු 10කි. |

II පත්‍රය සඳහා මුළු ලකුණු = 20 + 20 + 15 + 15 + 10 = 80

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 120 |
| II පත්‍රය | = | 80 |
| අවසාන ලකුණ | = | 200 ÷ 2 = 100 |


## 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- මෙහි මුල් ප්‍රශ්න 4ට පිළිතුරු සැපයීම අනිවාර්ය වුව ද 1 ප්‍රශ්නය සඳහා 99%ක් ද 2වන ප්‍රශ්නය සඳහා 90%ක් ද 3 ප්‍රශ්නය සඳහා 73%ක් ද 4 ප්‍රශ්නය සඳහා 62%ක් ද පිළිතුරු සපයා ඇත. 5, 6, 7, ප්‍රශ්න අතුරෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. අංක 5 ප්‍රශ්නය 32%ක් ද 6, 7 ප්‍රශ්න සඳහා පිළිවෙළින් 8%ක් හා 11%ක් වශයෙන් ද අපේක්ෂකයන් විසින් පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇත.


## 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- අංක 1 ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු 20න් මෙම ප්‍රස්තාරයට අනුව 76% - 100% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 16 - 20 අතර ලබා ගත් ප්‍රතිශතය 1%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙනි. එනම් ලකුණු 0 - 5 අතර ලබා ගත් ප්‍රතිශතය 57%කි.

## 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




(RD/16/4/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත. අපේක්ෂකයන් වැඩි ම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇතස (iii) (අ) අනු කොටසෙහි පහසුතා දර්ශකය 0.66කි. එනම් (iii) (අ) අනුකොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 66%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම අනුකොටසෙහි පහසුතාව 66%කි. අපේක්ෂකයන්ගෙන් අවම සංඛ්‍යාවක් සාර්ථක පිළිතුරු සපයා ඇති 2(ii) (ආ) අනුකොටසෙහි පහසුතා දර්ශකය 0.07කි. එනම් 2(ii) (ආ) අනුකොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 7%ක් පමණක් සාර්ථකව පිළිතුරු සපයා ඇති අතර ඒ අනුව එම කොටසෙහි පහසුතාව 7%ක් ලෙස දැක්විය හැකිය.

## 3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය

### 1 ප්‍රශ්නය

අපේක්ෂණය : නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ව්‍යුහය : කෙටි පිළිතුරු අපේක්ෂිත අනුකොටස් දෙක බැගින් යුත් කෙටි ප්‍රශ්න දහයක් ඇතුළත් වේ.

අංක (i) සිට (x) තෙක් සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

(i) (අ) පන්සිය පනස් ජාතක කථා පොත රචනා කිරීමේ දී මූලාශ්‍රය කොට ගෙන ඇති කෘතිය කුමක් ද?

(ආ) 'චුල්ලහංස' ජාතකයේ වර්තමාන කථාවට පාදක වී ඇති සිදුවීම කුමක් ද?

(ii) (අ) 'සද්ධර්මාලංකාරය' කෘතිය සිංහල පාඨකයාට සුවිශේෂ වන්නේ ඇයි?

(ආ) මෙම කෘතිය රචනා වී ඇත්තේ කාගේ ඇරයුමක් පරිදි ද?

(iii) (අ) 'සැළලිහිණි සංදේශය' රචනා කිරීමේ අරමුණ වූයේ කුමක් ද?

(ආ) සැළලිහිණි සංදේශ කතුවරයා රචිත තවත් සංදේශ කාව්‍යයක නම ලියන්න.

(iv) (අ) පාලි රසවාහිනිය කෘතිය ලිවීම සඳහා පාදක කරගෙන ඇති පැරණි බණ කථා කෘති දෙක නම් කරන්න.

(ආ) බුත්සරණ සහ පූජාවලිය කෘති රචනා වී ඇත්තේ කුමන අවධිවල දී ද?

(v) "දෙයියෝ අපට තවත් තෑග්ගක් එවල නේද"

(අ) මෙහි සඳහන් වන තෑග්ග කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කා හට කියන ලද්දක් ද?

(vi) (අ) අරිසෙන් අහුබුදු කවියාගේ 'මඟුල් ගීය' කවිපෙළ රචනා වී ඇත්තේ කවර කරුණක් පාදක කරගෙන ද?

(ආ) අහස බලව් !
එහෙන් මෙහෙන්
නො එක් පාට
කොඩි ඇදිලා

මෙම කාව්‍ය ඛණ්ඩය ඇතුළත් කාව්‍ය නිර්මාණය නම් කර ඇත්තේ කුමන නමකින් ද?

(vii) (අ) 'හැවිල්ල' කාව්‍ය නිර්මාණයෙහි රචකයා නම් කරන්න.

(ආ) පරාක්‍රම කොඩිතුවක්කු කවියා අයත් වන්නේ කොළඹ යුගයේ කුමන කාණ්ඩයට ද?

(viii) පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

සුර රද සමන් සමගින් සුරගන එවර
පැහැනද මදාරා පරසතු මල් පතර

(අ) ............................................

(ආ) ............................................

(ix) (අ) 'සද්ධර්මරත්නාවලිය' කෘතියේ සෑම කතාවක ම පාහේ ආරම්භයේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණය සඳහන් කරන්න.

(ආ) සද්ධර්මරත්නාවලිය කෘතියට මූලාශ්‍රය වූ පාලි ධම්මපදට්ඨකථාව රචනා කර ඇත්තේ කවරෙක් ද?

(x) "හැම තැන දී ම පිරිමින් උපදෙස් දනිති නැත. සමහර තැනක ගෑනු ද උපදෙස් දනිති"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

1. (i) (අ) පාලි ජාතකට්ඨකථාව
(ආ) බුදුරජුන් නාලගිරි මතැතු දමනය කිරීමේ සිදුවීම

(ii) (අ) ලක්දිව කථා ප්‍රවෘත්ති ඇතුළත් කළ ප්‍රථම බණ කථා සංග්‍රහය වීම
(ආ) ප්‍රියදර්ශී නම් භික්ෂුවකගේ

(iii) (අ) රාජ්‍යත්වයට සුදුසු කුමරකු ලබා දෙන ලෙස කරන ඉල්ලීමකි
උලකුඩය/ ලෝකනාථා දේවියට පුත් කුමරකු ලබා දෙන ලෙස කරන ඉල්ලීමකි
(ආ) පරෙවි සංදේශය

(iv) (අ) සහස්ස වත්ථුප්පකරණය
සීහල වත්ථුප්පකරණය
(ආ) බුත්සරණ පොළොන්නරු අවධිය
පූජාවලිය දඹදෙණි අවධිය

(v) (අ) මුව පැටියා
(ආ) හින්නි හාමි සිලිඳුට

(vi) (අ) අවුරුදු කාලය/ වසන්ත කාලය
(ආ) ඉර සහ සඳ

(vii) (අ) රැ. තෙන්නකෝන්/ රැයිපියෙල් තෙන්නකෝන්
(ආ) නිදහස් කවියේ ද්විතීය යුගයට


(viii) (අ) කරපුද වඳින රැඳි මුනි සිරිපා තඹර
(ආ) සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර

(ix) (අ) අපේක්ෂිත පරමාර්ථයට සංක්ෂේප කර දැක්වීම /
අපේක්ෂිත දහම් රස සාරය හකුළුවා දැක්වීම
(ආ) බුද්ධඝෝෂ අටුවාචාරීන්

(x) (අ) සොර පව්වේ වසන දේවතාණන්
(ආ) සොර, සිටු දුවණිය/ කුණ්ඩලකේසී මරන්නට සිතූ ආකාරයත් එයින් බේරීම සඳහා ඇය සොරා ගල් පව්වෙන් පහළට දැමූ ආකාරයත් යන මේ දෙදෙනාගේ ම කටයුත්ත දුටු දේවතාණෝ මෙසේ කිවූහ.

**(ලකුණු 02×10=20යි)**

## 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





1 ප්‍රශ්නය තෝරා ගෙන ඇති පිරිස 99%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් 0 - 5 ප්‍රාන්තරයේ 57% ක් ද,
6 - 10 ප්‍රාන්තරයේ 32% ක් ද,
11 – 15 ප්‍රාන්තරයේ 10% ක් ද,
16 - 20 ප්‍රාන්තරයේ 01% ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් පිරිස 89%කි. ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 11%කි.



මෙම ප්‍රශ්නය කොටස් 10කින් ද අනුකොටස් 20කින් ද සමන්විතය. ඒ අතුරෙන් වැඩි ම පහසුතාව (iii) (අ) සහ (i) (අ) අනුකොටස් වේ. එහි පහසුතාව පිළිවෙළින් 66%ක් හා 54%කි. පහසුතාව අඩු ම (ii) (අ) අනුකොටස වන අතර එහි පහසුතාව 8%ක් වේ. (ii) (ආ) සහ (ix) (අ) අනුකොටස්වල පහසුතාව 12%ක් තරම් අඩු අගයකි. මෙම ප්‍රශ්නවලට අමතර ව පහසුතාව අඩු ම කොටස් වන්නේ (iv) (අ) (ආ) (vi) (අ) (ආ) (x) (අ) අනුකොටස්ය. ඒ අනුව එම අනුකොටස්වල පහසුතා පිළිවෙළින් 15%, 17%, 16%, 16% හා 17% කි. පොදුවේ ගත් කළ සෙසු අනුකොටස් සඳහා පහසුතාව 21% සිට 39% දක්වා විහිදී පැවතිණි.

මෙම ප්‍රශ්න විශ්ලේෂණය කළ විට පහත සඳහන් කරුණු ඉදිරිපත් කළ හැකි ය. ඒ අනුව (i) ප්‍රශ්නයේ (අ) අනුකොටස පන්සිය පනස් ජාතක පොත පාදක කරගෙන ද (ii) කොටස සද්ධර්මාලංකාරය කෘතිය පාදක කරගෙන ද (iii) සහ (viii) කොටස් සැළලිහිණි සංදේශය කෘතිය පාදක කරගෙන ද (iv) කොටස (ආ) බුත්සරණ පූජාවලිය කෘති ඇසුරෙන් ද (v) කොටස බැද්දේගම නවකතාව පාදක කරගෙන ද (vi), (vii) නිර්දිෂ්ට නූතන පද්‍ය ඇසුරෙන් ද (ix) හා (x) කොටස් සද්ධර්මරත්නාවලිය ඇසුරෙන් ද සැකසී තිබුණි.

මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ දී පහසුතා අඩු වීමෙන් පැහැදිලි වන්නේ නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පද්‍ය කෘති පරිශීලනය සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන දුර්වලතාවයි.

මෙම තත්ත්වය මග හරවා ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම ඉහළ අගයකට ගෙන ඒමට නම් නිර්දිෂ්ට ග්‍රන්ථ අනුසාරයෙන් අනුමාන ප්‍රශ්න සකසා පිළිතුරු ලිවීම, වාචික කෙටි ප්‍රශ්න තරග පැවැත්වීම, අදාළ පද්‍ය කෘතිවලින් සුදුසු කවි තෝරා දී ඒවා වන පොත් කරවීමට සැලැස්වීම වැනි කරුණු කෙරෙහි ගුරුවරයා සැලකිලිමත් වුවහොත් ඉහළ සාධන මට්ටමක් වෙත ශිෂ්‍යයා යොමු කරවීමට හැකි වනු ඇත.

**2 ප්‍රශ්නය**

අපේක්ෂණය : නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය ඇති ව පාඨය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම

ව්‍යුහය : නිර්දිෂ්ට ගද්‍ය/ පද්‍ය පාඨ ඇසුරෙන් ප්‍රශ්න සැකසී ඇත

පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා, ඒ එකිනෙකට අදාළ ව (i) සිට (v) තෙක් දී ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. *(ලකුණු 04 × 5 = 20 යි)*

(i) "යම් සේ සෙවිල්ල දන්නවුන් යහපත් කොට සොයා ලූ ගෙය එක්තරා වැස්සකින් තබා මහත් වැස්සකිනුත් නො තෙමේ ද එපරිද්දෙන් ද්විප්‍රකාර භාවනා නමැති තර සෙවිල්ලෙන් සොයා ලූ සිත් නමැති ගෙය සතර මහ මුහුදු පුරන තරම් වූ කෙලෙස් මහ වැසි වටත් නො තෙමෙයි"

(අ) මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.

(ii) "එසේ වී නම් මා හැඟි පිළිත් හැඳ ගෙන මා හැඟි වූ ආභරණත් ලා ගෙන කෙළ ගෙන, සී ගෙන යන ගමන හෙයින් තොපගේ නෑයනුත් රඳවා ලා යම්හ යි" කිවූ ය. උයිත් තර ව සිත් ගත්ට ම සිතන හෙයින් එලෙස ම කළහ.

(අ) මෙහි සඳහන් අය, යන්නට සැරසුණේ කොහි ද?

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.

(iii) විදෙන ලෙළෙන තරුබර පුළුලුකුළැ  රැඳී
හෙළන නඟන අත නුවනග බැලුම්  දිදී
රුවින දිලෙන අබරණ කැලුම ගත  යෙදී
සැලෙන පහන සිළු වැනි රඟන ලිය  සැදී

(අ) මෙහි රඟන ලියන් උපමා කොට ඇත්තේ කුමකට ද?

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.

(iv) "එසඳ සුමුඛ නම් හංස සේනාධිපති මහරජ, නුඹ වහන්සේ සියලු මනුෂ්‍යයන්ට නායක සේක. මුන් වහන්සේ සියලු හංසයන්ට නායක සේක. එසේ වූ උත්තමයන් කථා කරන්නා වූ ස්ථානයට පැමිණියා වූ මම පේළා බන්ධනයට අසු ව නාග රාජයක්හු පරිද්දෙන් සෙල් වී ගත නොහෙමි"

(අ) හංස සේනාධිපති මෙම ප්‍රකාශය කිරීමට හේතුව කුමක් ද?

(ආ) මෙහි සඳහන් වන උපමාව උපුටා දක්වන්න.

(v) උණුසුම සිසිලස හඳුනම් ගුණයෙන් රෑ දාවල එක පරිදි  ගෙවේ
කැලඹී පාවෙමි දුම් රොටුවක් මෙන් යට ගිය මතකෙහි සිහින  ලොවේ
මවගේ කටහඬ වෙනසක් නොමැති ව සැඟ වී ඇත ඔබ මුවෙහි  දුවේ
ඈ දුන් රන්මල් මදහස එපරිදි ඇද්දැයි අත ගා බලමි  මුවේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයෙන් මෙහි සඳහන් තැනැත්තාගේ කවර ලක්ෂණයක් මතු කෙරෙයි ද?

(ආ) මෙහි දැක්වෙන උපමාව සහ රූපකය වෙන වෙන ම ලියන්න.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) (අ) නන්ද කුමරුන් රහත් භාවයට පත් නියාව නොදන්නා භික්ෂූන් වහන්සේලා නන්ද කුමරුන් ගිහිවීමට ආලයක් නැතැයි යනුවෙන් කරන ප්‍රකාශය ගැන සැක සිතී ඒ පිළිබඳව බුදුරජාණන් වහන්සේගෙන් විමසූ විට බුදුරජාණන් වහන්සේ දුන් පිළිතුරයි.

(ආ) ද්විප්‍රකාර භාවනා  දෙයාකාර භාවනා/ සමථ, විදර්ශනා භාවනා
තර සෙවිල්ලෙන්  ස්ථිරව කරන ලද සෙවිලි කිරීමෙන්

(ii) (අ) සොර පව්වේ දෙවියන්ට කළ යාදින්නක් ඔප්පු කිරීම සඳහා එම ස්ථානයට යාමට

(ආ) කෙළ ගෙන  කෙළිදෙලෙන්
සී ගෙන  සිනහවෙන්

(iii) (අ) සැලෙන පහන් සිළුවලට

(ආ) නුවනග බැලුම්  ඇස් කොණින් බලන බැලුම්
අබරණ කැලුම  ආභරණවල කාන්තිය

(iv) (අ) හංස රජ්ජුරුවන්ගෙන් බණ ඇසීමෙන් අනතුරුව සුමුඛ නම් හංස සේනාධිපතිගෙනුත් බණ ඇසීමට කැමති බව රජතුමා ප්‍රකාශ කළ අවස්ථාවේ සේනාධිපති රජතුමාට කළ ප්‍රකාශයකි.


(ආ) පේළා බන්ධනයට අසු ව නාග රාජයක්හු

(v) (අ) අන්ධ අයකු බව

(ආ) උපමාව  දුම් රොටුවක් මෙන්
රූපකය  රන්මල් මදහස

**(ලකුණු 04×5=20යි)**


## 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




අයදුම්කරුවන් ප්‍රශ්න සඳහා ප්‍රතිචාර දක්වා ඇති ආකාරය සැලකීමේ දී මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 90%ක් වුව ද නිවැරදි පිළිතුර ඉදිරිපත් කිරීමේ ප්‍රතිශතය අවම වී ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වේ.

ඉන් 0 - 5 ප්‍රාන්තරයේ 57% ක් ද,
6 - 10 ප්‍රාන්තරයේ 32% ක් ද,
11 – 15 ප්‍රාන්තරයේ 10% ක් ද,
16 - 20 ප්‍රාන්තරයේ 01% ක් ද,
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 89%කි. ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 11%කි.




මෙම ප්‍රශ්නය කොටස් පහකින් ද අනුකොටස් 10කින් ද සමන්විත වේ. ඒ අතුරෙන් වැඩි ම පහසුතාව (iii) කොටසෙහි (අ) අනුකොටස වන අතර එහි පහසුතාව 42%කි. (i) කොටසෙහි (අ) අනු කොටසෙහි පහසුතාව 9%කි. (v) කොටසෙහි (අ) අනුකොටසෙහි පහසුතාව 14%ක් ද (ආ) අනුකොටසෙහි පහසුතාවය 25%ක් ද විය. අනෙක් කොටස්වල අනුකොටස් සඳහා පහසුතාව 7% සිට 28% දක්වා විහිදී පැවතිණි. පුරාතන ගද්‍ය පද්‍ය හා නූතන පද්‍ය සාහිත්‍යයට අයත් පාඩම්වල කතාසාරය, අවස්ථා හා සිද්ධි මතකයේ රැඳෙන ආකාරයට ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීමට ගුරුභවතුන් යොමු විය යුතු අතර එයින් අපේක්ෂකයන්ගේ සාධන මට්ටම වර්ධනය කර ගැනීමට මග පෙන්වීම වැදගත් වේ. නිර්දිෂ්ට සාහිත්‍ය කොටස් ඇසුරෙන් නිරන්තර අභ්‍යාසවල යෙදවීම මගින් සාර්ථක පිළිතුරු අපේක්ෂා කළ හැකි ය.

**3 ප්‍රශ්නය**

අපේක්ෂණය : ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීම

ව්‍යුහය : විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විතය.

'නැළවිල්ල' කවි පෙළින්
(අ) අජීව වස්තූන් මෙන් ම
(ආ) ජීව වස්තූන් ද
පුතුගේ නින්දට බාධා නොකරන අයුරු කවියාගේ සංකල්පනාවට භාජනය වී ඇත.
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

බැද්දේගම නවකථාවෙහි
(අ) ග්‍රාමීය මධ්‍යම පන්තියත්
(ආ) දරිද්‍රතාවෙන් පීඩා විඳින පන්තියත්
මැනවින් නිරූපිත ය.
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) (අ) උදා:

- උණු වැඩියැයි හිරුගේ රැස්<br>තෙමා නැවත ගෙනෙන වෙස්
- සිහිල් වෙතියි සඳ ඉතා<br>හාවා එහි පැන ගතා
- හෝරා යතුරක් අපේ<br>පතා ඔබට නිඳි සැපේ<br>ගෙවෙනා සැටියට කපේ<br>පුරුදු පරිදි නො වැලපේ
- සුවඳ ගෙනෙන මලුයනා<br>සුළඟ කවුළු තිරයෙනා<br>තද ගති අඩු කැරැ ගෙනා<br>එයි ඔබ හට දී සිනා
- ගඟ ද සුළඟ සමගිනී<br>කකා නොකර පෙරැ මෙනී
- ජීව වස්තූන් ද අජීව වස්තූන් ද පුතුගේ නින්දට බාධා නොකරන අයුරු ඉහත උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අවශ්‍යය.
- වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.

(ආ) උදා:

- සුරතල් දරු බිය වෙතී<br>කුරුලු පැටවු නො හඬතී
- වසු පැටියෝ ගෙල පසා<br>මිණිවැල් සෙලැවෙන නිසා<br>රිසි ලෙස ඇඟ නොමැ කසා<br>නිඳති තණට ඇස වසා

- හූනෝ එළියට	අවුත්
  මැස්සන් පස්සෙන්	ගතොත්
  නගති වි උන් හඬ	මහත්
  කට මැ කටෙහි ලා	ගනිත්

- සඳ පානේ වැලි	තලා
  සුර කුමරියෝ මල්	සලා
  නටති මෙ දෙස බල	බලා
  ගිගිරි වළලු පය	නොලා

නැතහොත්

(අ) බබෙහාමි ආරච්චිරාළ, ප්‍රනාන්දු මුදලාලි, පුංචිරාළ, වැනි චරිත ඒ ඒ අවස්ථාවල දී හැසිරෙන ආකාරය ගමේ දුප්පත් මිනිසුන් අපහසුතාවට පත් කරන ආකාරය නිදසුන් දක්වමින් විස්තර කර තිරීම අවශ්‍ය ය.

බබෙහාමි ආරච්චිල

- උළු සෙවිලි කළ ගෙයකට මුළු ගමේ ම තිබුණේ ගම්මුලාදෑනියා වූ බබෙහාමි ආරච්චිලගේ ගෙය පමණයි.
- ගමේ මිනිසුන් තලා පෙලා කටයුතු කිරීම ඔහුගේ සිරිත විය.
- බබෙහාමි ගමේ ප්‍රධානියා නැත්නම් මුලාදෑනියා වූයේ ගමේ සිටියවුන් අතුරෙන් නම ලියන්නට හැකි වූ එකම මිනිසා වීම නිසා ය.
- මුළු ගමේ ම අණසක පතුරවා ගැනීමට ඔහු සමත් විය.
- ඔහු සතුව යම් වත්කමක් ද පැවතියේ ය.

ප්‍රනාන්දු මුදලාලි

- ගමේ සියලු දෙනාම ඔහුට ණය වී තිබුණි.
- අස්වැන්න නෙළන කාලයට ගමට පැමිණෙන ඔහු ලබා දී තිබූ ණයට සරිලන අස්වනු කොටස් ගැමියන්ගෙන් ලබා ගත්තේ ය.
- නැවත ණය ගැනීමට සිදුවන හෙයින් ගම් වැසියෝ ඔහුට අවනත වී සිටියහ.
- කඹුරුපිටියේ පදිංචිකරුවකු වන ඔහු ආරච්චිලගේ හිතවතකු වූ අතර බබුන් හා සිලිඳු කරදරවලට පත් කිරීමට කටයුතු කළ අවස්ථා බොහෝ විය.

පුංචිරාළ

- ඔහු ගම්මුන් අතර ප්‍රසිද්ධව සිටියේ වෙදරාලකෙනෙකු හා කට්ටඩිරාලකෙනෙකු ලෙසට ය.
- තම සහෝදරා සමග ඇති කර ගත් අරගලයේ දී ඔහු හැසිරුණු ආකාරය නිසා ගම්මු ඔහුට බිය වූහ
- යන්ත්‍ර මන්ත්‍ර දන්නා බව ඇගවීමත් එමගින් කළ හැකි බොහෝ දේ ගැන කියා ගම්මුන් බිය වැද්දීමටත් ඒ අනුව ඔහුගේ කටයුතු ඉටුකර ගැනීමට අවශ්‍ය අවස්ථා උදාකර ගැනීමටත් ඔහු දක්ෂයෙක් විය.

(ආ) බබුන්, සිලිඳු, හින්නිහාමි, පුංචිමැණිකා, වැනි චරිත හැසිරෙන ආකාරය විස්තර කරමින් පිළිතුරු සපයා තිබීම අවශ්‍යය.

බබුන්

- ආරච්චිලගේ මස්සිනා වුව ද ඔහු සිලිඳුගේ දුව වූ පුංචිමැණිකා විවාහ කරගෙන ජීවත් වූ අහිංසක ගැමියෙකි.

- ගොවිතැන් කටයුතු සාර්ථකව කිරීමට අවශ්‍ය මංපෙත් නොමැති වීමෙන් ප්‍රනාන්දු මුදලාලිට ණය ගෙවීමට සිදු වී තිබුණි.

- ශක්තිමත් ආර්ථිකයක් ගොඩනගා ගැනීමට ඔහුට හැකියාවක් නොලැබෙන අතර මෙය අවස්ථාවක් කර ගන්නා ප්‍රනාන්දු මුදලාලි ඔහුගේ බිරිඳ ගැන අයුතු යෝජනාවක් කිරීමට ද පෙලඹෙයි.

- එයට විරුද්ධ වීම නිසා බොරු චෝදනාවකට සිපිරිගෙට යාමට ද ඔහුට සිදුවිය.

සිලිඳු

- ආරච්චිලගේ සොහොයුරියක විවාහ කර ගන්නා ඔහු දරිද්‍රතාවෙන් පෙලෙන ගැමියෙකි.

- හේන් ගොවිතැන් කිරීමේ දී අලසයකු වූ ඔහුගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ දඩයමයි.

- තම බිරිඳට නිවුන් දරුවන් බිහි කිරීමේ දී කෝපයට පත්වන ඔහු ඇයට ගුටිබැට දීමට පෙලඹෙන්නේ ද දඩයමේ යාටම කොලුවෙකු බිහි නොකිරීම නිසාය.

- ආරච්චිරාල හා ප්‍රනාන්දු මුදලාලිගේ කියුම් කෙරුම් හමුවේ අසරණ වන ඔහු අවසානයේ ඔවුන් දෙදෙනා වෙඩි තබා මරා දමයි.

හින්නිහාමි, පුංචි මැණිකා

- අහිංසක ගැමි චරිත වුව ද අවශ්‍ය අවස්ථාවල දී ඇඩි සිත් ඇති අයය.

- සිලිඳු ගමෙන් පිට ගිය බොහෝ විට වනමුල්, වනඵල, වනකොළ ආදිය කෑමෙන් කුසගිනි නිවා ගැනීමට සිදුවීම

- පියා වගා කටයුතුවල නොයෙදීම හේතුවෙන් දරිද්‍රතාවෙන් යුත් ජීවිත ගත කිරීමට සිදුවීම

- හින්නිහාමිගේ ජීවිතය අවසාන වන අයුරු


- පුංචිමැණිකාගේ ජීවිතය අවාසනාවන්ත වන අයුරු

වැනි අවස්ථා උදාහරණ ලෙස දක්වමින් පැහැදිලි කිරීම අවශ්‍ය කොටස් දෙකට චරිත දෙක බැගින් උදාහරණ දක්වා තිබිය යුතු ය.

**(ලකුණු 15යි)**

| | |
|---|---|
| උදාහරණවලට 02 බැගින් ලකුණු | 04යි |
| විස්තර කිරීමට ලකුණු | 11යි |
| ලකුණු | 15යි |


**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




තුන්වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වූවකි. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් පිළිතුරු සපයා ඇත්තේ 73%ක් පමණි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු ප්‍රමාණය 15 කි.

ඉන් 0 - 3 ප්‍රාන්තරයේ 36%ක් ද,
4 - 7 ප්‍රාන්තරයේ 36%ක් ද,
8 – 11 ප්‍රාන්තරයේ 23%ක් ද,
12 - 15 ප්‍රාන්තරයේ 05%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 7ක් හෝ 7ට අඩුවෙන් ලබා ගත් පිරිස 72%කි. ලකුණු 8ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 28%කි.




3 ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

එම ප්‍රශ්න දෙක අතුරෙන් පළමුවන ප්‍රශ්නයෙහි පහසුතාව 45%කි. අනෙක් ප්‍රශ්නයෙහි පහසුතාව 37%කි. මෙම පළමුවන විකල්ප ප්‍රශ්නයෙහි පහසුතාවට වඩා විකල්ප දෙවන ප්‍රශ්නයෙහි පහසුතාව අඩු වී ඇති බව පෙනේ. නැළවිල්ල කවි පෙළ ඇසුරෙන් සකසා තිබූ පළමුවන ප්‍රශ්නයට වඩා බැද්දේගම නවකතාව ඇසුරෙන් සැකසුණු දෙවන ප්‍රශ්නයේ පහසුතාව අඩු වී ඇත.

නූතන සාහිත්‍යය ඇසුරෙන් සැකසෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ගේ පරිචයක් ඇති කිරීමට සුදුසු ඉගැන්වීමේ ක්‍රම අනුගමනය කිරීමට ගුරුභවතුන් යොමු විය යුතු ය.

සමස්තයක් වශයෙන් ගත් කළ මෙකී ප්‍රශ්න පිළිබඳ පන්ති කාමරයේ දී සාකච්ඡා කිරීම හා ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කිරීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම මගින් නිර්දිෂ්ට කෘති කෙරෙහි අපේක්ෂකයන්ගේ ප්‍රතිචාරය වර්ධනය කිරීමෙන් පිළිතුරු සැපයීමේ හැකියාව සතුටුදායක මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වේ.

**4 ප්‍රශ්නය**

අපේක්ෂණය : ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීම

ව්‍යූහය : විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විතය.

(අ) සිද්ධි පෙළ ගැස්වීමත්

(ආ) අවස්ථා වර්ණනයත්

අතර ඇති මනා සුසංයෝගය සැළලිහිණි සංදේශ කාව්‍යය පාඨක සිත් අමන්දානන්දයට පත් කිරීමට සමත් වෙයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

චුල්ලහංස ජාතක කථාවේ

(අ) හංස රජුගේ චරිතයෙන් නායකත්ව ලක්ෂණත්

(ආ) හංස සේනාධිපතිගේ චරිතයෙන් කල්‍යාණ මිත්‍රත්ව ලක්ෂණත් මනාව පිළිබිඹු කෙරෙයි.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

*(ලකුණු 15 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) (අ) **සිද්ධි පෙළගැස්වීම**

- ආශිර්වාදය
  - ⋆ සැරද සුලකුළකුරු මියුරු තෙපලෙන් රඳනා
- සැපදුක් විමසීම
  - ⋆ පුල්මල් කෙසරුමෙන් රන්වනි තෙලෙ සරණ යුග
  - ⋆ තොප දැකුමෙන් අප පින්කළ බව දැනිණි
- කටයුත්ත පිළිබඳ දැනුම් දීම
  - ⋆ දෙව් මෙහසුන් විබිසණ සුරිඳුට පවර
- ජයවද්දන පුර වැනුම්
  - ⋆ පොහොසත් දන ඇති තුනුරුවන බැති පෙමා
  - ⋆ සැදි රත තඹර පෙළ රන තිසරුන් රුවැති
- ගමන් පිරුම
  - ⋆ උදේ සැපත් සුරගුරු අලු කර අවට
- දළදා වැනුම
  - ⋆ වඳු දළදා හිමි තෙමහල් පැහැය රැඳී
- රජ දැක්ම
  - ⋆ රිවි බිම්බා යුරු රිවි කුළ කමල කර
- නික්මුම
  - ⋆ කරව පියාසර සකි කොන්ත ගං තොටින්
- නිසා වැනුම්, උදා වැනුම්, මග වැනුම්, කැලණි පුර වැනුම්

(ආ) අවස්ථා වර්ණනය

- වලඳින අදහසින් මෙන් සුර ගඟ අඟන
- සුරරඳ සමන් සමගින් සුරඟන එවර
- නිල තුරඟට නැගෙමින් රිවි දෙව් සිරින
- නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුල
- රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසී
- බන්නේ මරා මිණිදුල පබළු මුතු ඇට
- මනහර නා මෙණෙවියනිඳ ළවැලි පිට
- වදිමින් සවස නල හැසිරෙන දිගතු වල
- උදුළ සොම් කැලුම් නිසයුරු හිමි පවුල
- පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
- විදෙන ළෙළෙන නරු බර පුළුලුකුළැ රැඳී

වැනි උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අවශ්‍යය.
සුදුසු වෙනත් උදාහරණ ද පිළිගන්න.

**(ලකුණු 15යි)**

**නැතහොත්**

(අ) **හංස රජුගේ චරිතයේ නායකත්ව ලක්ෂණ**

- මානසවිල වෙත යාමට අවශ්‍ය බව හංසයන් ප්‍රකාශ කිරීම නිසා එහි යාමේ භයානක බව පැහැදිලි කිරීම හා එහි යාම වළක්වාලීමට උත්සාහ ගැනීම
- හංසයන් නැවත නැවත කළ ඉල්ලීමට අනුව ඔවුන්ට නායකත්වය සපයමින් එහි යාමට පියවර ගැනීම
- මලෙහි අසුවුණු හංස රජු ඇඩි දුක්වේදනා ලැබුවත් වේදනා පිටතට නොපෙන්වා බන්ධූහු භයපත් ව ගොදුරු නොකා සාදුකින් පලා යාම මග හැරීම සඳහා පියවර ගැනීම
- තමා නොමැති වීමෙන් බන්ධු වර්ගයාට ඇතිවන අඩුව පුරවන ලෙස හංස සේනාධිපතිට ප්‍රකාශ කිරීම

(ආ) **හංස සේනාධිපති කල්‍යාණ මිත්‍රත්ව ලක්ෂණ**


- හංස රජුට භය පැමිණියේ වනැයි සිතා යළි එම විල වෙත පැමිණීම
- මලෙහි බැඳුණු හංස රජු අස්වසාලීමට පියවර ගැනීම
- සුවසේ සිටින අවස්ථාවේ සේවය කොට දුකට පැමිණි අවස්ථාවේ හැර නොයන බව ප්‍රකාශ කිරීම
- මිය යතොත් එකට මිය යන බවත් ගැලවී යතොත් හංස රජු සමගම බව ප්‍රකාශ කිරීම
- හංස රජුට යමක් සිදු වන්නේ නම් එය තමා ද විඳිනු කැමති බව ප්‍රකාශ කිරීම
- ජීවිත සමාන වූ මිත්‍රයා කිසිඳු විටක දී හැර නොයන බව වැදි පුත්‍රයාට ප්‍රකාශ කිරීම
- තමා හැර ගෙන හංස රජු මුදා හරින ලෙස වැදි පුත්‍රයාගෙන් ඉල්ලා සිටීම

දී ඇති උදාහරණ සහිත ව අවස්ථා විස්තර කරමින් පිළිතුරු ලියා තිබීම අවශ්‍යය.
වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්නා ලදි.

**(ලකුණු 15යි)**

| | |
|---|---|
| උදාහරණවලට 02 බැගින් ලකුණු | 04යි |
| විස්තර කිරීමට ලකුණු | 11යි |
| ලකුණු | 15යි |

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා**





හතරවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වුවකි. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 62%ක් පමණි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 15කි.

ඉන්

0 - 3 ප්‍රාන්තරයේ 39% ක් ද,
4 - 7 ප්‍රාන්තරයේ 32% ක් ද,
8 – 11 ප්‍රාන්තරයේ 24% ක් ද,
12 - 15 ප්‍රාන්තරයේ 05% ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 7ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය 71%කි. ලකුණු 8ක් හෝ ඊට වැඩියෙන් ලබා ගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 29%කි.




4 ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. ''සැළලිහිණි සංදේශය'' ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නය සඳහා පහසුතාව 47%ක් වන අතර ''වුල්ල හංස ජාතක කතාව'' ඇසුරෙන් සකස් වූ විකල්ප ප්‍රශ්නයෙහි පහසුතාව 37%කි. ඒ අනුව ප්‍රශ්නයට අදාළ ව පිළිතුරු ගොනු කිරීමේ දී වුල්ලහංස ජාතක කතාවෙන් උදාහරණ සැපයීම, සැළලිහිණි සංදේශය ඇසුරෙන් උදාහරණ සැපයීමට වඩා සංකීර්ණ වීමක් දැකිය හැකි විය.

නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න පිළිබඳ ව අයදුම්කරුවන් දැනුවත් කිරීමත් ප්‍රශ්නයට අදාළ ව පිළිතුරු ගොනු කර ගැනීමට හුරු කිරීමත් අවශ්‍ය බැවින් පන්ති කාමරයේ දී ඒ පිළිබඳ ව අවධානය යොමු කිරීමට ගුරුභවතුන් කටයුතු කළ යුතු බව අවධාරණය කෙරේ.

## 5 ප්‍රශ්නය

**අපේක්ෂණය : විචාර හා රසවින්දන හැකියාව මැනීම**
**ව්‍යූහය : 5, 6, 7, ප්‍රශ්නවලින් එකක් තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතු ය.**

නුවණැත්තන් ප්‍රඥාවෙන් යුතු ව කටයුතු කිරීමෙන් ජීවිත ජය ගන්නා අයුරු කුණ්ඩලකේසී කතාවස්තුවෙන් මැනවින් නිරූපිත ය. උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

- සොරු කුණ්ඩලකේසීව මරා අහරණ හැර ගෙන පලා යන්නට සොර පව්වට ඇය රැගෙන ආ බව ප්‍රකාශ කළ අවස්ථාවේ එය වළක්වා ගැනීමට කළ ඉල්ලීම පිළි නොගැනීම නිසා ඇය තම සිත දැඩි කර ගැනීම
  ''දැන් මරතී කියා මුසුප්පු වන්නට පිළිවන් ද? බල එකෙක් නම් මියන ගමනේ මා සිතත් මතත් සේ වැඳ ගත දුන මැනව'' යනුවෙන් ප්‍රකාශ කොට ඔහු කැමති කරවා ගෙන ඔහු වඳින නියාවෙන් ඔහු වටා පැදකුණු කොට ගලෙන් පහළට පෙරළා දමා තම ජීවිතය බේරා ගැනීම

- යළි තමාට ගෙට යාමෙන් සිදුවන ආදීනව නිසා අහරණ ද එතැන්හිම දමා වල් වැදීම


- පසුව ඒ ඒ තැන ඇවිද යන අතරතුර පරිව්‍රාජිකාවරුන් වසන පන්සලකට ගොස් තමා මහණ කරන ලෙස ඉල්ලා සිටීම

- වාද දහස ඉගෙන ගැනීමට ගත් තීරණය

- සැරියුත් මහ තෙරුන් හා වාදයට එළඹීමෙන් අනතුරුව බුද්ධ ශාසනයෙහි මහණ වී රහත් භාවයට පත් වීම

**උදාහරණ තුනක් දක්වමින් පිළිතුරු ලියා තිබීම අවශ්‍ය විය. (ලකුණු 10 යි)**

### 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





මෙම ප්‍රශ්නය සද්ධර්මරත්නාවලියේ, කුණ්ඩලකේසීගේ වස්තුව ඇසුරෙන් සැකසී ඇත. අපේක්ෂකයන්ගෙන් 32%ක් පමණ ඊට පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 10කි.

ඉන්

0 - 2 ප්‍රාන්තරයේ 34% ක් ද,
3 - 5 ප්‍රාන්තරයේ 52% ක් ද,
6 – 7 ප්‍රාන්තරයේ 12% ක් ද,
8 - 10 ප්‍රාන්තරයේ 2% ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

ලකුණු 6ක් 10ත් අතර ලබා ගෙන ඇති ප්‍රතිශතය 14%කි. 86%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




සද්ධර්මරත්නාවලියේ කුණ්ඩලකේසී වස්තුව ඇසුරෙන් පිළිතුරු ලිවීමට තිබූ මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 32%කි. නිර්දිෂ්ට පුරාතන සාහිත්‍ය කෘති පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කිරීමත් ඒ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න කෙරෙහි අපේක්ෂකයන්ගේ අවධානය යොමු කිරීමත්, නිරන්තර අභ්‍යාසවල නිරත කරවීමත් මගින් මෙවැනි ප්‍රශ්නවලට උපරිම ලකුණු ලබා ගැනීමට අවස්ථාව සැලසිය හැකි ය. ඒ පිළිබඳ ගුරුභවතුන්ගේ අවධානය යොමු විය යුතු බව අවධාරණය කෙරේ.

**6 ප්‍රශ්නය**

**අපේක්ෂණය : විචාර හා රසවින්දන හැකියාව මැනීම**

**ව්‍යූහය : 5, 6, 7, ප්‍රශ්නවලින් එකක් තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතු ය.**

6. සද්ධර්මාලංකාර කතුවරයාගේ අභිප්‍රාය වී ඇත්තේ කිසියම් කතාවක් ඉදිරිපත් කොට එමගින් දහම් රසය කුළු ගැන්වීම යි. නිර්දිෂ්ට කථා වස්තු ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

- **ධම්මසවණෝපාසිකා වස්තුව**

  - උපාසිකාවගේ චරිතය මගින් ධර්මය ශ්‍රවණය කිරීමේ ආනිසංස ගෙන හැර දැක්වීම
  - සත්‍ය ක්‍රියා මගින් සර්පයෙකු දෂ්ට කිරීමෙන් විසංඥ වූ තම පුතු සුවපත් කර ගැනීම
  - කරන ලද පින්කම්වල අනුභාවයෙන් උපාසිකාව දිව්‍යලෝකයෙහි ඉපදීම

- **කුඩඩරජජ වස්තුව**


  - බණ අසමින් සිටි තෙරුන්වහන්සේ පොළගකු විසින් දෂ්ට කිරීමත් උන්වහන්සේ බණ ඇසීමට ඇති ලැදියාව නිසා එතැනින් ඉවත්ව නොයා පොළගා පසුම්බියක දමා ගැට ගසා පසෙක තබා ධර්මය ශ්‍රවණය කිරීම
  - ධර්මශ්‍රවණයේ ආනුභාවයෙන් උන්වහන්සේගේ ශරීරයේ විෂ ව්‍යාප්ත නොවීම
  - ශේෂව තිබූ විෂ ද සත්‍ය ක්‍රියානුභාවයෙන් නැති කර ගැනීම ආයු කෙළවර දෙව්ලොව ඉපදීම
  - ධර්මශ්‍රවණයේ ආනිසංසයෙන් දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිර්වාණ සම්පත්තිය ලබා ගත හැකි බව පසක් කිරීම

  ඉහත උදාහරණවලින් තුනක් දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය විය.
  සුදුසු වෙනත් උදාහරණ ද පිළිගන්නා ලදි.

**(ලකුණු 10 යි)**

කතා වස්තු දෙකෙන් උදාහරණ දක්වා තිබීම අවශ්‍ය විය.


**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා**




මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 8%කි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු ගණන 10කි.
ඉන්

| | | | |
|---|---|---|---|
| 0 - 2 | ප්‍රාන්තරයේ | 49% ක් ද, |
| 3 - 5 | ප්‍රාන්තරයේ | 32% ක් ද, |
| 6 – 7 | ප්‍රාන්තරයේ | 19% ක් ද, |
| 8 - 10 | ප්‍රාන්තරයේ | 00% ක් ද |

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. අපේක්ෂකයන්ගෙන් 81%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත. 6, 7ත් අතර ලකුණු ලබා ගත් අපේක්ෂක ප්‍රතිශතය 19%කි. ලකුණු 8ත් 10ත් අතර ලබා ගත් අපේක්ෂක ප්‍රතිශතය 00%කි.




සද්ධර්මාලංකාරය ඇසුරෙන් පිළිතුරු ලිවීමට තිබූ මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 27%කි. 5,6,7 යන ප්‍රශ්නවලින් අපේක්ෂකයන් අඩු ම සංඛ්‍යාවක් තෝරා ගෙන ඇති මෙම ප්‍රශ්නයට අඩු පහසුතාවක් ලැබීමට ද හේතු වී ඇත්තේ නිර්දිෂ්ට පුරාතන ගද්‍ය කෘතිය පිළිබඳ ව අපේක්ෂකයන්ගේ අවධානය නිසි පරිදි යොමු වී නොතිබීමත් පුරාතන සාහිත්‍ය පිළිබඳ අවබෝධ කර ගැනීමට අවශ්‍ය නිසි මඟ පෙන්වීම නොලැබීමත් ය.

**7 ප්‍රශ්නය**

**අපේක්ෂණය : විචාර හා රසවින්දන හැකියාව මැනීම.**

**ව්‍යුහය : 5, 6, 7 ප්‍රශ්නවලින් එකක් තෝරාගෙන පිළිතුරු ලිවිය යුතු ය.**

ගැමි ජනයාගේ නිර්ව්‍යාජ සිතුම්පැතුම් කවියට නැගීමට කොළඹ යුගයේ කවීන් උත්සුක වූ අයුරු නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න.


**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

- කුරක්කන් හේන
- අයියනායක
- අඳුර අපේ දුක නිවාවි
- ධීවරී ගීතය
- හැවිල්ල

වැනි පද්‍ය පන්තිවලින් උදාහරණ දක්වමින් විස්තර කිරීම අවශ්‍යය **(ලකුණු 10 යි)**

| | |
|---|---|
| 5, 6, 7 ප්‍රශ්න සඳහා උදාහරණ තුනට | **ලකුණු** 03යි |
| විස්තර කිරීමට | **ලකුණු** 07යි |
| | **ලකුණු** 10යි |

**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





ගැමි ජනතාවගේ නිර්ව්‍යාජ සිතුම් පැතුම් කවියට නැගීමට කොළඹ යුගයේ කවීන් උත්සුක වූ ආකාරය පාදක කර ගෙන සැකසුණු මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂක සංඛ්‍යාව 11%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන්

| | | |
|---|---|---|
| 0 - 2 | ප්‍රාන්තරයේ | 35% ක් ද, |
| 3 - 5 | ප්‍රාන්තරයේ | 15% ක් ද, |
| 6 – 7 | ප්‍රාන්තරයේ | 32% ක් ද, |
| 8 - 10 | ප්‍රාන්තරයේ | 18% ක් ද, |


වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 50%කි. අපේක්ෂකයන්ගෙන් 50% ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 35%කි. කොළඹ කවීන්ගේ නිර්මාණවලින් නිර්දිෂ්ට පද්‍ය ඇසුරෙන් සැකසී ඇති මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන්ගෙන් ලකුණු 6ට වඩා අඩුවෙන් ලබා ගෙන ඇති 50% අතුරෙන් ලකුණු 0ත් 2ත් අතර ලබා ගෙන ඇති සංඛ්‍යාව 35%කි. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නයට අපේක්ෂකයන් සපයා ඇති පිළිතුරු ප්‍රශස්ත මට්ටටමක නොතිබූ බවයි.
මෙ මගින් ගම්‍ය වන්නේ නූතන පද්‍ය රස වින්දනය සඳහා නිසි මග පෙන්වීමක් අපේක්ෂකයන්ට ලබා දීමේ අවශ්‍යතාවයි. ඒ අනුව නූතන පද්‍ය අනුසාරයෙන් සකසා ගත හැකි ප්‍රශ්න පිළිබඳ ව අපේක්ෂකයන් දැනුවත් කිරීමටත් පිළිතුරු ලිවීම සඳහා නිසි පුහුණුවක් ලබා දීමටත් නිරන්තරයෙන් අභ්‍යාසවල යෙදවීමටත් ගුරු භවතුන්ගේ අවධානය යොමු විය යුතු ය.

## 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




II ප්‍රශ්න පත්‍රයේ 1,2,3,4 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
1 වන ප්‍රශ්නය මගින් නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් කෙටි පිළිතුරු සැපයිය හැකි අනුප්‍රශ්න 10ක් ඉදිරිපත් කර ඇත. එම ප්‍රශ්න (අ) (ආ) ලෙස නැවත කොටස් දෙකකට බෙදා ඇත. ඒ අනුව කොටස් 20 සඳහා ලකුණු 20ක් හිමි වේ. එයට 99% පිළිතුරු සපයා තිබුණ ද එහි පහසුතාව 24%කි.

2 වන ප්‍රශ්නය සැකසී ඇත්තේ නිර්දිෂ්ට ග්‍රන්ථවල ගද්‍ය පද්‍ය පාඨ ඇසුරෙනි. නිර්දිෂ්ට පාඨ 5ක් ඇසුරෙන් ප්‍රශ්න සැකසෙන අතර එක් කොටසකට ලකුණු 4 බැගින් ලකුණු 20ක් හිමි වේ. මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 90%ක් වන නමුත් එහි පහසුතාව 19%කි.

3 හා 4 ප්‍රශ්නවලින් නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ විශ්ලේෂණාත්මක දැනුම ඇගයීමට ලක් කෙරේ. මෙහි දී විකල්ප ප්‍රශ්න තෝරා ගැනීමේ අවස්ථාව ද අපේක්ෂකයන්ට හිමි වේ. මෙම ප්‍රශ්න දෙකට ලකුණු 15 බැගින් හිමි වේ.

3 වන ප්‍රශ්නය ''නැළවිල්ල'' කවි පෙළ හා බැද්දේගම නවකතාව ඇසුරෙන් සැකසුණු විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත ය. මෙම ප්‍රශ්න දෙකෙහි පහසුතාව පිළිවෙළින් 45% හා 37% වශයෙනි. මෙම ප්‍රශ්න දෙකේ ම සමස්ත පහසුතාව 41%කි.

4 වන ප්‍රශ්නය ද විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත ය. එහි සැළලිහිණි සංදේශය ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නයේ පහසුතාව 47%කි. චුල්ලහංස ජාතක කථාව ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නයේ පහසුතාව 37%කි. මෙම ප්‍රශ්න දෙකේ ම සමස්ත පහසුතාව 42%කි.

5,6,7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරා ගෙන පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ට අවස්ථාව සලසා තිබේ. එම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ. ඉන් 7වනප්‍රශ්නය පහසුතාව වැඩි ම ප්‍රශ්නය යි. එහි පහසුතාව 35%කි. අඩු ම පහසුතාව පෙන්නුම් කරනුයේ 6 වෙනි ප්‍රශ්නය යි. එහි පහසුතාව 27%කි.

## 4.0 පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් අවධානය යොමු කළ යුතු කරුණු

**පොදු උපදෙස්**

- ⋆ ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතු ය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතු ය. මේ සඳහා අමතර කියවීම් කාලය ඵලදායී ලෙස භාවිත කළ හැකි ය.

- ⋆ ප්‍රශ්න පත්‍රයේ පළමු කොටසට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ එක් පිළිතුරක් පමණක් තෝරා ගත යුතු ය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයා තිබේ දැයි සුපරීක්ෂාකාරී විය යුතු ය.

- ⋆ I ප්‍රශ්න පත්‍රයේ II කොටසට හා II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

- ⋆ නිවැරදි හා පැහැදිලි අත්අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

- ⋆ අපේක්ෂකයාගේ විභාග අංකය හා පිටු අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.

- ⋆ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතු ය. අදාළ අවස්ථාවල දී සුදුසු නිදසුන් ඉදිරිපත් කළ යුතු ය.

- ⋆ පිළිතුරු සමන්විත විය යුතු වචන සංඛ්‍යාව දී ඇති විට එම වචන සංඛ්‍යාවට හැකි තරම් ආසන්න වචන සංඛ්‍යාවකින් යුතු වන සේ පිළිතුරු සංවිධානය කර ගත යුතු ය. එසේ නොවීම ලකුණු අඩුවෙන් ලැබීමට හේතු විය හැකි ය.

- ⋆ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී කාලය නිසි පරිදි කළමණාකරණය කරගැනීමට වග බලා ගත යුතු ය.

- ⋆ පිළිතුරු ලිවීමේ දී නිල් හෝ කළු පැහැ තීන්ත සහිත පෑන් පමණක් භාවිත කළ යුතු ය.

- ⋆ පිළිතුරු ලිවීමට සැපයෙන පොතේ සඳහන් විශේෂ උපදෙස් ද කියවා අවබෝධ කර ගත යුතු ය.

**විශේෂ උපදෙස්**

- ⋆ අත් අකුරු හා අක්ෂර වින්‍යාසය පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

- ⋆ ශිල්පීය දක්ෂතා එනම් පද බෙදීම, විරාම ලක්ෂණ, අදාළ පරිදි ඡේද වෙන් කොට ලිවීම යන අංග පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

## 5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

- ★ සිංහල අක්ෂර මාලාව පිළිබඳ ව පෙළපොත්වල ඇති පාඩම්, දෘශ්‍යාධාර හා ගුරු මාර්ගෝපදේශ ග්‍රන්ථ භාවිත කරමින් නිවැරදි ව ලිවීමේ හැකියාවත් අක්ෂර මාලාවේ ඇති විවිධ ප්‍රභේද පිළිබඳව නිවැරදි අවබෝධයත් ලබා දීම අවශ්‍ය ය.
- ★ අක්ෂර වින්‍යාසය බොහෝ විට වැරදි ලෙස භාවිත කෙරෙන වචන තෝරා ගෙන ඒවා නිවැරදි ව භාවිත කිරීම සඳහා සතතභ්‍යාස කළ යුතු ය.
- ★ උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව පෙළපොතේ දැක්වෙන අභ්‍යාසවලට අමතර ව තවත් අභ්‍යාසවල යොදවමින් ක්‍රියාකාරකම්වල නිරත කළ යුතු ය.
- ★ කර්මකාරක හා කතෘකාරක වාක්‍ය පිළිබඳ සිසුන්ගේ අවබෝධය සතුටුදායක නොවන බැවින් මනා ඉගැන්වීම් ක්‍රම මගින් හා වඩ වඩාත් අභ්‍යාසවල යෙදවීම මගින් භාවිත හැකියාව ඉහළ නැංවීමට පියවර ගත යුතු ය.
- ★ සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහ්වර්ථ පද ඇතුළු වාග් කෝෂය සංවර්ධනය සඳහා උපකාර වන සරල අභ්‍යාසවල නිරත වීමට අවස්ථා සම්පාදනය කළ යුතු ය.
- ★ ව්‍යාකරණ ඉගැන්වීමේ දී ප්‍රායෝගික ජීවිතය ඇසුරෙන් නිදර්ශන සපයමින් රසවත් ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රම ගුරුවරුන් විසින් නිර්මාණය කර ගත යුතු ය.
- ★ රචනා ලිවීමේ දී ව්‍යුහගත රචනාවක් යනු කුමක් දැයි පැහැදිලි කර විභාගයේ දී එවන් රචනාවකට ලකුණු ලැබෙන පිළිවෙළ හා ලකුණු ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳ ව මග පෙන්වීමක් කළ යුතු ය.
- ★ ප්‍රායෝගික ලේඛන ලිවීමේ දී ඒ ඒ ලේඛනවල වෙනස හඳුන්වා දී ආකෘතිවල වෙනස්කම් සිසුන්ට පැහැදිලි කර දිය යුතු ය. වාර්තා, අත්පත්‍රිකා, දැන්වීම්, රාජකාරී ලිපි ඇතුළු ලේඛන කුසලතා ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික ලේඛන අද්දැකීම් ලබා දීමට ක්‍රියා කළ යුතු ය.
- ★ පැරණි ගද්‍ය සාහිත්‍ය පාඩම් සිසුන් ලවා කියවීම හා කියවීමෙන් අවබෝධය ලබා ගැනීමේ අවස්ථාව ලැබෙන පරිදි අභ්‍යාස සැලසුම් කළ යුතු ය.
- ★ සාහිත්‍ය පෙළපොතෙහි පාඩම් මගින් රසාස්වාදය සඳහා ඉඩ ප්‍රස්තා ලැබෙන පරිදි හැකි සෑම විට ම නාට්‍යානුසාරයෙන් ඉගැන්වීමට සුදුසු ඉගෙනුම් - ඉගැන්වීම් අවස්ථා සම්පාදනය කළ යුතු ය.
- ★ නිරන්තර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අමතර ව සිසුන් නිර්මාණකරණයේ යෙදවීමට ද උනන්දු විය යුතු ය.
- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී අඩු සාධන මට්ටමක් සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.
- ★ වාර විභාග ලකුණු පදනම් කර ගනිමින් සිංහල විෂය සමත් වීමේ ලකුණු සීමාවට ආසන්න වී ඇති සිසුන් සඳහා කෙටි කාලීන ප්‍රතිකාරක වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු ය.
- ★ සංවේදීභාවයෙන් හා රසඥතාවෙන් පිරිපුන් රසිකයකු බිහි කිරීමෙහි ලා සාහිත්‍යයෙන් සිදු වනුයේ අනුපමේය මෙහෙයකි. එවන් පුද්ගලයන් සමාජයට මහඟු සම්පතකි. සමාජය මිනිස්කමින් පුරවන්නට නම් සාහිත්‍යය කෙරෙහි සිසුන් වඩාත් හොඳින් යොමු කරවීම කාලීන අවශ්‍යතාවකි. මේ පිළිබඳව ගුරුභවතුන් ඇතුළු අදාළ නිලධාරීන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.